ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

இலங்கை புத்தாக்குனர் ஆணைக்குழு

SRI LANKA INVENTORS COMMISSION



වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT 2020

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

திறன் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சு

State Ministry of Skills Development,Vocational Education, Research & Innovation

වාර්ෂික වාර්තාව - 2020

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ලිපිනය : 46 & 48, කොටා පාර, කොළඹ 08.
දුරකථන : 011-2676650 ෆැක්ස් : 011-2676646
ඊ මේල් : info@slic.gov.lk වෙබ් අඩවිය : www.slic.gov.lk

පටුන

කොමිසමෙහි සාමාජිකයින් 4

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 5

කොමසාරිස්තුමාගේ පණිවිඩය 6

හිටපු කොමසාරිස්තුමාගේ පණිවිඩය 7-8

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 9

1.1 හැඳින්වීම 9

1.2 දැක්ම 9

1.3 මෙහෙවර 9

1.4 පරමාර්ථ 9

1.5 කොමිසමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන් 10

1.6 ආයතනික සැලැස්ම 11

1.7 මානව සම්පත 12

2. 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන් 13

2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන "සහසක් නිමැවුම් 2020" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය 13-14

2.2 නව නිපැයුම් හා නවෝත්පාදන ඵලදායී ලෙස වාණිජකරණයට නව වැඩපිළිවෙලක් 15

2.3 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM-SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය 15

2.4 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන "නව නිපැයුම් දිරිය" 15-16

2.5 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers) 17

2.6 වාණිජකරණ ක්‍රියාන්විතයේ දේශීය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය ගොඩනැංවීම 18

2.7 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම 19-20

2.8 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය 21

2.9 කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් 22-31

2.10 පර්යේෂණයන් එළිදැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සමුළුව - "From Innovation to Impact - FITI" 32

2.11 දේශීය නවෝත්පාදකයන් දිරිගැන්වීම සඳහා වූ ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශන සහභාගීත්වය 33-35

2.12 නවෝත්පාදන සමාජගත කිරීමේ පළාත් වැඩසටහන් 35

2.13 නව නිපැයුම්කරුවන් දැනුවත් කිරීම සඳහා සජීවී වැඩසටහන් 36

2.14 නව නිපැයුම් ප්‍රචලිත කිරීම 36-41

2.15 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය 41

2.16 මානව සම්පත් සංවර්ධනය 41

3. මූල්‍ය ප්‍රකාශනය 42-62

කොමිසමෙහි සාමාජිකයින්

ඩබ්. ඒ. නිමාලි කුලතුංග මහත්මිය (2020.01.01 සිට 2020.03.01 දක්වා)
කොමසාරිස් (වැ.බ.)

මහාචාර්ය රංගික උමේෂ් හල්වතුර මහතා (2020.03.16 සිට 2020.12.31 දක්වා)
කොමසාරිස්

වෛද්‍ය සනත් හෙට්ටිගේ මහතා (2020.05.11 සිට 2020.07.31 දක්වා)
සහකාර කොමසාරිස්

මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය (2020.11.20 සිට 2020.12.31 දක්වා)
සහකාර කොමසාරිස්

ඒ. පී. එස්. එල්. විජේසිංහ මහතා (2020.11.20 සිට 2020.12.31 දක්වා)
සහකාර කොමසාරිස්

පී. වී. බී. පී. සිසිර නන්දන මහතා (2020.01.01 සිට 2020.12.31 දක්වා)
භාණ්ඩාගාර නියෝජිත

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

පී. වී. බී. පී. සිසිර නන්දන මහතා (2020.01.01 සිට 2020.12.31 දක්වා)
භාණ්ඩාගාර නියෝජිත

වෛද්‍ය සනත් හෙට්ටිගේ මහතා (2020.05.11 සිට 2020.07.31 දක්වා)
සහකාර කොමසාරිස්

මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය (2020.11.20 සිට 2020.12.31 දක්වා)
සහකාර කොමසාරිස්

ඒ. පී. එස්. එල්. විජේසිංහ මහතා (2020.11.20 සිට 2020.12.31 දක්වා)
සහකාර කොමසාරිස්

එච්. ඩී. අනුරුද්ධිකා මහත්මිය (2020.01.01 සිට 2020.12.31 දක්වා)
අභ්‍යන්තර විගණක
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

ඩබ්. පී. එල්. එස්. ආර්. පෙරේරා මහත්මිය (2020.01.01 සිට 2020.12.31 දක්වා)
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

කොමසාරිස්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ බලාත්මක කිරීමේ මූලික පරමාර්ථය වන්නේ දේශීය නවෝත්පාදනය දිරිගන්වමින්, නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා නීතිමය සහයෝගය ලබාදීමයි.

මේ වන විටත් සාර්ථක වැඩසටහන් සමූහයක් ක්‍රියාත්මක කරමින් උක්ත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට දරණ උත්සාහයේ සාර්ථකත්වය ශ්‍රී ලාංකේය ජනසමාජය මත ඇති කරන සුභවාදී බලපෑම අතිමහත්ය. ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම තුලින් සෑම ක්ෂේත්‍රයක් තුලම නිර්මාණශීලිත්වය පුබුදුවාලමින් දේශීය ආර්ථිකය නඟා සිටුවීමට දායකත්වය සැපයීම කොමිසමේ අරමුණ වේ.

නව නිපැයුම්කරුවාගේ සුවිශේෂී හැකියාව හඳුනාගෙන එම දක්ෂතාවය ප්‍රායෝගිකව උපයෝගි කර ගනිමින් ඒ ඔස්සේ නව නිපැයුම්කරුවනට සුවිශේෂී ප්‍රතිලාභ හා අත්දැකීම් ලබා දෙමින් අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට කොමිසම මඟින් මේ වන විටත් ප්‍රායෝගික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මෙහිදී ශ්‍රී ලාංකේය ජන සමාජයම ආවරණය වන අයුරින් පාසැල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන, විවෘත හා වාණිජකරණ යනුවෙන් හඳුනාගත් ප්‍රධාන සමාජ ස්ථර හතරක් සහ හඳුනාගත් නවෝත්පාදන ක්ෂේත්‍ර 14 ක් ඉලක්ක කර ගනිමින් නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කොමිසම කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වර්තමාන කොමසාරිස් ලෙස මේ වන විට කොමිසම මඟින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන සියළුම ව්‍යාපෘතීන් නව මුහුණුවරකින් හා වඩාත් ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීමටත්, අලුතින් නව වැඩසටහන් හඳුන්වා දීමටත්,

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින දක්ෂතා වලින් පරිපූර්ණ නව නිපැයුම්කරුවන් හඳුනා ගනිමින් ඔවුන් ජාතික තලයට හා අන්තර්ජාතික මට්ටමේ නව නිපැයුම්කරුවන් බවට පත්කිරීමටත්, කොමිසමට අවශ්‍ය නායකත්වය සැපයීම අරමුණු කර ඇත.

මෙහිදී අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය උපරිම දායකත්වය නවෝත්පාදන ප්‍රවර්ධනය මඟින් සැපයීමට කොමිසම කටයුතු කරන අතර එයට සමගාමීව නව නිපැයුම්කරුවන් සහ නවෝත්පාදකයන් සොයා ශ්‍රී ලංකාවම ආවරණය වන ලෙස ගම් පියැසි වෙත පිය නැඟීමටද සැලසුම් කර ඇත.

මේ සෑම කාර්යයක් වෙනුවෙන්ම පාලක මණ්ඩල මඟපෙන්වීම යටතේ ඉතාමත් සීමිත වූ කාර්යමණ්ඩලයේ දායකත්වය උපරිමව හිමි වන අතර කොමිසමේ සාර්ථකත්වය සඳහා ද එය මනා පිටුවහලක් වේ.

ශ්‍රී ලාංකේය නිපැයුම්කරුවන්ගේ අනාගතය උදෙසා අපරිමිත සේවයක් කළ, ඉටු කරන්නාවූ සියළුම දෙනා වෙත කොමිසමේ කෘතවේදීත්වය පිරිනමන අතර කොමිසමේ කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම සහ පහසුකම් ලබා දෙන ගරු රාජ්‍ය ඇමතිතුමිය, විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ මැතිණිය, රේඛීය අමාත්‍යංශයේ ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ද, කොමිසමේ පාලක මණ්ඩල සාමාජිකයින් සියලු දෙනාටද මාගේ කෘතවේදීත්වය පල කර සිටින අතරම නව නිපැයුම් බිහිකරමින් රට තුල නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීමට දායකත්වය දක්වන හා දැක්වූ සියළුම නව නිපැයුම්කරුවන් හට මාගේ සුභාශිංසනය පිරිනමන්නෙමි.

මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු
කොමසාරිස්
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

හිටපු කොමසාරිස්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වන්නේ දේශීය නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන දිරිගන්වමින් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික, මූල්‍යමය හා නෛතික සහයෝගයන් ලබාදීමට කටයුතු කිරීමයි.

එම මූලික කාර්යභාරයන්ට අනුගත වන අතරම, දේශීය ආර්ථිකය සවිමත් කිරීම වෙනුවෙන් නව නිපැයුම් හා නවෝත්පාදන වාණිජකරණය කිරීමේ දැවැන්ත මෙහෙවරට උරදීමට කොමිසමට මේ වන විටත් හැකියාව ලැබී තිබීම සතුටට කරුණකි.

නව නිපැයුමක් ගොඩනැංවීම ම පමණක් කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර, එය ඵලදායී නිෂ්පාදනයක් ලෙස සමාජගත කිරීම අනිවාර්යයෙන් කළ යුතු වේ. ඒ සඳහා නිවැරදි මඟ පෙන්වීමක් නව නිපැයුම්කරු වෙනුවෙන් අවශ්‍ය වන අතර, එම නිසි මඟ පෙන්වීම හරහා නව නිපැයුම් නිවැරදිව සමාජගත කරමින්, වෙළෙඳ පොළ වෙත යොමු කිරීමට නව යාන්ත්‍රණයක් මේ වන විට ද ක්‍රියාත්මක වෙමින් පවතී.

සිය ජනතා මෙහෙවර උපරිම අයුරින් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ක්‍රියාවට නංවනු ලබන වැඩසටහන් කිහිපයක් පහතින් දක්වා ඇත.

- කාලීන සමාජ ගැටළු සඳහා සාර්ථක නවෝත්පාදන විසඳුම් ලබාදෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශීය වශයෙන් "COVID 19", වසංගතය පිටුදැකීම සඳහා, Fight Against COVID 19, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා එතුලින් ප්‍රයෝජනවත් නව නිපැයුම් සාර්ථකව සමාජගත කිරීමට කටයුතු සැලැස්වීම.
- අලි-මිනිස් ගැටුම සඳහා සාර්ථක විසඳුම් ලබාදෙමින්, හඳුනාගත් ප්‍රදේශ කිහිපයක "අලි වැට" නවෝත්පාදනයක් ලෙස ස්ථාපිත කිරීමට කටයුතු කිරීම සහ එමඟින් අදාල නව නිපැයුම් වාණිජකරණයට අවස්ථාව සැලසීම.
- කෘෂිකර්ම සහ ආහාර තාක්ෂණය ඉලක්ක කර ගත් නවෝත්පාදන වැඩසටහන හරහා නව නිපැයුම්කරුවන්ට ආයෝජන අවස්ථාවන් උදා කර දීම.
- දේශීය තේ කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් නවෝත්පාදන විසඳුම් ලබාදීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ද සහයෝගය ඇතිව "Tea Talk" වැඩසටහන නිර්මාණය කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රයෙන් බලශක්ති අර්බුදයට විසඳුම් සෙවීම සඳහා නවෝත්පාදන වැඩසටහනක් සැලසුම් කිරීම.
- "සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය හරහා දේශීය නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට අමතරව විදෙස් නව නිපැයුම්කරුවන්ගේ සහභාගීත්වය හරහා විදෙස් විනිමය මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.
- දේශීය නව නිපැයුම්කරුවන් හට ආයෝජකයින් හඳුන්වා දීම, අපනයන සහාය ලබාදීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- නව නිපැයුම්කරණයෙහි ඉදිරි ගමන ශක්තිමත් කිරීම උදෙසා යොවුන් නව නිපැයුම්කරුවන් ගේ උපරිම දායකත්වය ලබාගැනීම වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය ආයතනයන් හි ද සහයෝගය ඇතිව "යොවුන් නව නිපැයුම් සමාජ" පිහිටුවීම හා ක්‍රියාකාරිව පවත්වාගෙන යෑමට පියවර ගැනීම.
- නව නිපැයුම්කරණය සඳහා අවශ්‍ය නව තාක්ෂණික දැනුම ලබාදීම වෙනුවෙන් "Idea Incubator" වැඩසටහන සැලසුම් කිරීම.
- නවෝත්පාදනය ප්‍රචලිත කිරීම සඳහා චිත්‍රාගාර පහසුකම් සහිත "නිපැයුමාණි" වැඩසටහන සැලසුම් කිරීම.
- නව නිපැයුම් සඳහා දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලාංකික නවෝත්පාදකයන් හට සිය පර්යේෂණ එළිදැක්වීම සඳහා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ද දායකත්වය ඇතිව "From Innovation to Impact (FITI)" නමින් ප්‍රමිතිගත සමුළුවක් පැවැත්වීම.
- නව නිපැයුම් නිවැරදිව සමාජගත කිරීම, ප්‍රචලිත කිරීම, නවෝත්පාදනය කෙරෙහි ජනතා ආකර්ෂණය හා උද්‍යෝගය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා කිසිදු මුදල් වැය කිරීමකින් තොරව සාර්ථක විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම සමාජ මාධ්‍ය හා අන්තර්ජාලය ඔස්සේ නව තාක්ෂණය භාවිතා කරමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- "තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන" පිහිටුවීම හා ඒවායේ සක්‍රීය ක්‍රියාකාරිත්වය හරහා නව නිපයුම් වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම.
- "නව නිපැයුම් දිරිය", "IAFM-SL" වැනි ව්‍යාපෘතින් හරහා නව නිපැයුම් වල ගුණාත්මකභාවය ඉහළ නංවමින් ඒවා වෙළෙඳ පොළ වෙත ගෙන යෑමට අවශ්‍ය යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීම.
- දේශීය නව නිපැයුම්කරුවන් හට විදෙස් නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම.

ඉහතින් දක්වා ඇත්තේ කොමිසම විසින් මේ වන විටත් ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රමුඛ ගණයේ වැඩසටහන් පිළිබඳ සාරාංශයකි. රටේ ආර්ථිකයට මෙන්ම පුරවැසියන්ට ද ප්‍රතිඵලදායක වන තවත් විශේෂිත වැඩසටහන් ගණනාවක් ඉදිරි වර්ෂයන් හි ද ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ද සැලසුම් සකස් කරමින් පවතී.

රාජ්‍ය ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පැවරී ඇති කාර්යභාරය ද අභිබවා යමින් සුවිසල් ජාතික මෙහෙවරක් ඉටු කිරීමට ලැබීම අභිමානයෙන් යුතුව සිහිපත් කරන අතර, මේ වෙනුවෙන් නිරන්තර ශක්තියක් වන කොමිසමේ සීමිත කාර්යමණ්ඩලය වෙත කෘතවේදීත්වය පල කරමි. එමෙන්ම ඊට නිසි මඟ පෙන්වීමක් ලබාදුන් කොමිසමේ පාලක මණ්ඩල සාමාජිකයින්, රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් මෙන්ම සෙසු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙත ද හෘදයාංගම ප්‍රශංසාව පළ කරන අතර, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ඉදිරි ගමනේ දී ඔබ සැම ගේ සහයෝගය දැවැන්ත ශක්තියක් වනු ඇති බවට විශ්වාස කරමි.

මහාචාර්ය රංගික උමේෂ් හල්වතුර
හිටපු කොමසාරිස්
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ නිෂ්පාදනයන් දිරි ගැන්වීමත්, ඒවාට සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් වෙනුවෙන් 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

1.2 දැක්ම

"නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්"

(නව නිපැයුම් හා නවෝත්පාදන තුලින් සෞභාග්‍යය උදා කිරීම)

1.3 මෙහෙවර

ශ්‍රී ලාංකිකයන් ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීමේ ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම.

1.4 පරමාර්ථ

1.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නව නිපැයුම් කරනු ලැබීම හෝ නිර්මාණය කරනු ලැබීම වෙනුවෙන් ඔවුනට ධෛර්යය දීම.

1.4.2 නව නිපැයුම්කරුවනට තාක්ෂණික, මූල්‍ය හා නීති ආධාර ලබා දීම.

1.4.3 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්රුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් සියලූ බලතල, කර්තව්‍යය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

1.4.4 ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලූ කටයුතු කිරීම.

1.5 කොමිසමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන්

(අ) කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේදී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම් පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

(ආ) පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

(ඇ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම්වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නීතිමය කටයුතු වල දී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

(ඈ) නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවන්ට දීර්ඝ කාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීම. එහිදී නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

(ඉ) දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම.

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ජාතික ආරක්ෂාව, ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂාව හා සුභ සාධනය, පොදු කර්මාන්ත, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් විෂයන් හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියලු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්ය දීම.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවන්ට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(ඌ) "නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන" තරඟවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන "නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්" වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.

(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළ කිරීම සහ පතළ කර හැරීම.

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟවලට සහභාගිවීමට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟවලට ඔවුන් නිර්දේශ කිරීම.

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විශ්වවිද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

1.6 ආයතනික සැලැස්ම



1.7 මානව සම්පත

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2020 වර්ෂයේ කාර්ය මණ්ඩලය	2020 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	02	02	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මුදල්)	01	01	-
නීති නිලධාරී	01	-	01
වැඩසටහන් නිලධාරී	03	03	-
පරිපාලන නිලධාරී	01	01	-
මූල්‍ය නිලධාරී	01	01	-
පර්යේෂණ සහකාර	05	03	02
කළමනාකරණ සහකාර	07	07	-
රියදුරු	04	04	-
කාර්යාල සහායක	02	02	-

2. 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන "සහසක් නිමැවුම් 2020" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය

"සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය සංවිධානය කරන ලද්දේ නව නිපැයුම් නිවැරදිව සමාජගත කිරීම, ආයෝජක ප්‍රජාව හා සම්බන්ධ වෙමින් නව නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා රැගෙන යාම, දැනුම හා තාක්ෂණය සෙසු නිර්මාණකරුවන් සමඟ හුවමාරු කරගැනීම, ජයග්‍රහණ සඳහා නිසි ඇගයීමක් ලබාගැනීම මෙන්ම අන්තර්ජාතික මට්ටමේ ප්‍රදර්ශනයකට ඉදිරිපත් වීමේ අවස්ථාව හිමි කර ගැනීම යනා දී වූ විවිධ ප්‍රතිලාභ නව නිපැයුම්කරුවන් වෙත ලබාදීමේ අරමුණ ඇතිව ය.



දේශීය තරඟ අංශය නියෝජනය කරමින් පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් හා විවෘත යන ප්‍රධාන අංශ හතරක් යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14) ට අදාල වන පරිදි තරඟය සඳහා ඉදිරිපත් වීමට ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවනට අවස්ථාව සැලසේ.

- මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යාව හා තාක්ෂණය
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහනය
- ඉංජිනේරු

වර්තමානයේ උද්ගතව ඇති COVID-19 වසංගත තත්ත්වය හමුවේ වුව ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සිය වැඩසටහන් අකර්මණ්‍ය නොවී පවත්වාගෙන යනු ලබන අතර, ඒ සඳහා නව්‍ය ක්‍රමවේදයන් භාවිතා කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙසින් මෙතෙක් පළාත් මට්ටමේ දැනුවත් කිරීම් ඔස්සේ දිවයින පුරා විසිරී සිටින නිර්මාණශීලී ප්‍රජාව ඒකරාශී කරගනිමින් පැවැත්වූ සහසක් නිමැවුම්, මෙම වසරේ දී අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ මාර්ගගත (online competition) වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.





"සහසක් නිමැවුම් 2020" සඳහා දේශීය නව නිපැයුම් 538ක් හා විදෙස් නව නිපැයුම් 43ක් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. තරඟයේ සමස්ත අයදුම්පත් ඇගයීම සඳහා විශේෂඥ විනිසුරුමඩුල්ලක් සම්බන්ධව සිටින අතර, මේ වන විට විදෙස් තරඟ අංශයේ ඇගයීම් අතරින් රන් පදක්කම් 26ක් සහ රිදී පදක්කම් 17ක් වශයෙන් ජයග්‍රහණ ප්‍රකාශයට පත් කර තිබේ. දෙස් විදෙස් ජයග්‍රාහකයන්ට හිමි පදක්කම් හා සහතිකපත්‍ර ඔවුන් ගේ නිවෙස් වෙතටම ලබාදීමට ද කටයුතු සලස්වා තිබේ.

තව ද මෙම වසරේ දී ප්‍රථම වතාවට සහසක් නිමැවුම් තරඟය සඳහා කොමිසම විසින් ගොඩනගාගත් අන්තර්ජාතික සම්බන්ධතා උපයෝගී කරගනිමින් විදේශීය නව නිපැයුම් ආයතන වලින් පහත දක්වා ඇති පරිදි සුදුසුකම් ලත් විදේශීය ඇගයීම් මඩුල්ලක් පත් කර ගැනීමට හැකියාව ලැබුණි.

"සහසක් නිමැවුම්" යනු නව නිපැයුම්කරුවන්ට සිය නිපැයුම් ප්‍රදර්ශනය කිරීමට ගොඩනංවා ඇති සුවිශේෂී වේදිකාවක් වන අතරම, අනාගත අභියෝගයන්ට මුහුණ දෙමින්, විදිනෙදා ජීවිතයේ සුවපහසුව ලඟා කරදීම සඳහා වන තාක්ෂණික මෙවලම් වැඩිදියුණු කිරීම ඔස්සේ විශිෂ්ට ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම සඳහා වන ප්‍රධාන ප්‍රවේශ මාර්ගයක් ද වේ.

නවෝත්පාදන දිරිගැන්වීම හා සමගාමීව ආදායම් ඉපයීම හා දේශීය ආර්ථිකය ප්‍රවර්ධනය

2019 වසර දක්වා රාජ්‍ය භාණ්ඩාගාරය මත පමණක්ම යැපෙමින් සිය කාර්යභාරයට අවතීර්ණ වී සිටි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 2019 වසරේ සිට ආදායම් උපයන මාර්ගයට පිවිස හිඳී. ඒ අනුව, "සහසක් නිමැවුම්" කේන්ද්‍ර කර ගනිමින් 2019 වසරේ සිට විදෙස් නව නිපැයුම් ලියාපදිංචිය මඟින් ආදායම් ඉපැයීමට කොමිසමට හැකියාව ලැබී ඇත. ඒ අනුව, නව නිපැයුම් වාණිජකරණය තුලින් දේශීය ආදායමට ශක්තියක් ගෙනදෙනවාට අමතරව ආදායම් උපයමින් රාජ්‍ය භාණ්ඩාගාරයට අත්වැලක් සැපයීමට ද කොමිසමට හැකියාව ලැබී තිබේ.

වර්ෂය	උපයන ලද මුදල	
2019	විදේශීයව ලද	USD 900.00
2020	විදේශීයව ලද	USD 4,991.97
	දේශීයව ලද	Rs. 435,000.00

2.2 නව නිපැයුම් හා නවෝත්පාදන ඵලදායී ලෙස වාණිජකරණයට නව වැඩපිළිවෙලක්

දේශීය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වෙළෙඳපොළ වෙත යොමු කිරීමේ යාන්ත්‍රණය තවදුරටත් විධිමත් කරමින්, වාණිජකරණය කරන ලද නව නිපැයුම් වල ව්‍යාපාරික තත්ත්වය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම නව ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වී සිටියි. ස්ථාවර නව නිපැයුම්කරුවන් ගොඩනැංවීම හරහා ඔවුන් වෙතින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් ලබාගැනීම මෙහි අපේක්ෂාවයි. මෙම ක්‍රමවේදය නිෂ්පාදන භාගය (Royalty Payment) ඇතුලත් මූල්‍ය ණය පහසුකමක් ලෙස ක්‍රියාවට නැංවෙන අතර, කොමිසමෙහි නව නිපැයුම් අරමුදලේ ධාරිතාවය ඉහළ නංවමින් යළි යළිත් එම මුදල් නව නිපැයුම් වාණිජකරණය සඳහා යොදවා ගැනීමේ ඵලදායී වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

2.3 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM-SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වෙළෙඳ පොළ දක්වා ගෙන යාමට හා පර්යේෂණ සඳහා සහාය දක්වමින් ඒවා මුදල් බවට පරිවර්තනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් IAFM-SL ව්‍යාපෘතිය රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ කැබිනට් අනුමැතියක් මඟින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පවරා ඇත. මෙය කොමිසමේ පනත මඟින් දක්වා ඇති නව නිපැයුම් වාණිජකරණය සඳහා සහාය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක ය. නව නිපැයුමක් ලෙස බිහි වූ අවස්ථාවේ සිට වාණිජකරණය වූ නිමි භාණ්ඩයක් ලෙස සමාජ ගත වෙමින් නව නිපැයුම්කරුට පෞද්ගලිකව හා රටේ දේශීය අදායමට දායකත්වය සැපයීම සඳහා පහසුකම් සැලසීම, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මූල්‍යාධාර / ණය සඳහා අයදුම් කළ පසු අධීක්ෂණ කටයුතු පියවර ගණනාවක් යටතේ සිදු කරනු ලබයි.

2020 වර්ෂය සඳහා ඇගයීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය විනිශ්චය මණ්ඩලය ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික වාණිජ මණ්ඩලය, FCCISL, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය යනාදී ආයතන වෙතින් නාම යෝජනා කැඳවීමෙන් පසු තෝරාගන්නා ලදී.

ඉල්ලුම් කර තිබූ නව නිපැයුම් 10ක් අතරින් නව නිපැයුම් 02ක් මූලික සුදුසුකම් ලබා ඇති අතර, ඇගයීම් මණ්ඩල නිර්දේශ මත අදාල තත්ත්ව වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු එම ණය නිකුත් කරනු ලැබේ.

2.4 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන "නව නිපැයුම් දිරිය"

කොමිසම තුල ක්‍රියාත්මක නව නිපැයුම් වාණිජකරණයට ඇවැසි සහාය ලබාදීමේ අනෙක් වැඩසටහන "නව නිපැයුම් දිරිය - INVENT Grant Scheme" නමින් ක්‍රියාත්මක කරනු ලබයි. වාණිජකරණය සඳහා වෙළඳපොළ විභවයක් සහිත නව නිපැයුම් විද්වත් ඇගයීම් මඩුල්ලක සහභාගීත්වයෙන් අධීක්ෂණය කරන ලදුව ක්ෂේත්‍ර පරීක්ෂාවකින් තහවුරු කර, එම නිරීක්ෂණ රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතත්වයෙන් යුතු මූල්‍ය කමිටුවට ලබාදෙයි. එහිදී ගනු ලබන තීරණ පාලක මණ්ඩලයේ අනුමැතියෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

නව නිපැයුම් දිරිය යටතේ ආධාර ලබා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් පහත අයුරු වේ.

1. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු වීම.
2. බුද්ධිමය දේපල අයිතිය තහවුරු කරගෙන තිබීම හෝ ඒ සඳහා අයදුම් කර තිබීම.
3. ක්‍රියාත්මක මට්ටමේ ඇති මූලාකෘතියක් / නව නිපැයුම් ආකෘතියක් තිබීම.
4. නව නිපැයුම සඳහා ඉතා හොඳ වාණිජමය විභවයක් පැවතීම හෝ ප්‍රායෝගිකව සමාජයේ යහ පැවැත්ම සඳහා උපයෝගී කර ගත හැකි වීම.
5. දැනටමත් වාණිජකරණ මට්ටමේ නිෂ්පාදන ආරම්භ කර තිබීම හෝ ව්‍යාපාරික අවස්ථා සඳහා වන මූලික අවශ්‍යතාවයන් සපුරා තිබීම.

මෙම ක්‍රමවේදය තුලදී නව නිපැයුම් සඳහා මූල්‍යාධාර ලබාදීම වෙනුවට පොළී රහිතව, නැවත පියවීමට විකඟත්වය ඇති කර ගත් කාල සීමාව තුලදී එම මුදල නව නිපැයුම්කරු විසින් ගෙවිය යුතු වෙයි. ඇගයීම් කමිටුවේ නිර්දේශ මත නව නිපැයුම නිමි භාණ්ඩයක් දක්වා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය හෝ පරීක්ෂණ වාර්තා රාජ්‍ය ආයතනයක් හරහා ලබා ගැනීමට මුල්‍ය දායකත්වය ලබා දීම, පොළී රහිත ණය ලබාදීම, මූලාකෘති සකස් කිරීමට රාජ්‍ය ආයතනයක් හරහා සහයෝගය දැක්වීම යනාදී වශයෙන් විවිධ පැතිකඩ ඔස්සේ සහාය දක්වනු ලබයි.

මීට අමතරව වාණිජකරණ ක්‍රියාවලියේදී ඔවුන් ගේ නව නිපැයුම් වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා විවිධ තත්ත්ව පරීක්ෂණ වලට යොමු කරන අතර, 2020 වසරේ දී නව නිපැයුම් 07ක් එලෙස තත්ත්ව වාර්තා සඳහා යොමු කර ඇත.

COVID පසුබිම තුල හඳුනාගත් නව නිපැයුම් අතරින් නව නිපැයුම් දෙකක් (02) සඳහා ව්‍යාපාර ආරම්භක ණය ලෙස රු. 500,000.00 ක් ලබාදෙන ලදී. නව නිපැයුම් දිරිය වැඩසටහන යටතේ අයදුම්පත් 120ක් පමණ ඇගයීමට ලක් කරන ලදී. ඉදිරි කටයුතු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කරන ලද සංඛ්‍යාව 19ක් වන අතර, 2020 වසරේදී නව නිපැයුම් වාණිජකරණය සඳහා නව නිපැයුම්කරුවන් තිදෙනෙකුට රු. 2,524,250.00 ක් ණය වශයෙන් ලබාදී ඇත. එම වාණිජකරණ ක්‍රියාවලියේ 3%ක් (Royalty Payment) ලෙස ලබාගන්නා කොටස් ලෙස රු. 59,343.97ක සංචිතයක් 2020 වසර අවසාන වන විට ලැබී ඇත.







2.5 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers)

ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වාණිජකරණය සඳහා වූ මාර්ගය සකස් කිරීම වෙනුවෙන් එම නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට මෙම තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන පිහිටුවන ලදී.

2019 හා 2020 වර්ෂයන්හි දී තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන තෝරාගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාල 05 කින් ලැබුණු ව්‍යාපෘති යෝජනාවන් හි ඇගයීම් කටයුතු සම්පූර්ණ කර, එයින් රජරට හා රුහුණ යන විශ්වවිද්‍යාල වල තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබේ. රජරට විශ්වවිද්‍යාලයීය තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථානය සඳහා මිලියන 18.2 ක වටිනාකමින් යුත් යන්ත්‍ර සූත්‍ර හා රුහුණු විශ්වවිද්‍යාලයීය තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථානය සඳහා මිලියන 19.2 ක වටිනාකමින් යුත් යන්ත්‍ර සූත්‍ර ලබාදීමට 2020 වර්ෂයේ කටයුතු කරන ලදී. ඉදිරියේදී එම තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන ක්‍රියාකාරී මට්ටමට ගෙනඒමට කටයුතු කරමින් පවතී.

ජා-ඇල පිහිටි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි හා යාපනය විශ්වවිද්‍යාලයෙහි මේ වන විට මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කර ඇති අතර, එමඟින් ප්‍රාදේශීය මට්ටමේ නව නිපැයුම්කරුවන් 50කට පමණ පහසුකම් සලසා දී ඇත.











2.6 වාණිජකරණ ක්‍රියාන්විතයේ දේශීය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය ගොඩනැංවීම

නව නිපැයුම්කරුවන් හා අපනයනකරුවන් අතර සබඳතාවයක් ගොඩනැංවීම සඳහා ජාතික සංවර්ධන බැංකුව (National Development Bank - NDB) සමඟ පැවැති සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස "ජයගමු ශ්‍රී ලංකා" නමින් වැඩසටහනක් ආරම්භ කර තිබේ. ජාත්‍යන්තර වෙළෙඳ පොළ ආක්‍රමණය කළ හැකි නව නිපැයුම් හඳුන්වා දීම මඟින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මෙම වැඩසටහනට පහසුකම් සලසනු ලබයි.

දේශීය නිපැයුම්කරුවන් හට ආයෝජකයින් හඳුන්වා දීමටත්, අන්තර්ජාතික වෙළෙඳ පොළ වෙත යොමු වීමේ අවස්ථාව සැලසීමටත් මෙන්ම නවෝත්පාදන වාණිජකරණ ක්‍රමවේදය තුල කාන්තා සහභාගීත්වය සවිබල ගැන්වීමත් වෙනුවෙන් කොමිසම විසින් ශක්තිමත් පියවරක් තබා ඇත. ඒ අනුව ඉන්දියානු ව්‍යවසායකත්ව ඇකඩමිය (Indian Academy of Entrepreneurship - IAE) සමඟ සාකච්ඡා මාලාවක් පවත්වා ඇති අතර, ඉදිරියේ දී සුවිසල් සමාජ බලපෑමක් ඇති කළ හැකි වැඩසටහනක් ලෙස ක්‍රියාවට නැංවීමට නියමිත ය.

තව ද ශ්‍රී ලංකා අපනයන ක්ෂේත්‍රය නවෝත්පාදනයන් තුලින් විවිධාංගීකරණය කිරීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය (National Chamber of Exporters - NCE) හා අපනයන සංවර්ධන මණ්ඩලය (Export Development Board - EDB) සමඟ මුල් අදියරේ සාකච්ඡාවන් සාර්ථකව අවසන් කර ඇත.

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පදනම් කරගනිමින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ නව නිපැයුම් දිරිගැන්වීම සඳහා කොමිසම විසින් BCS (British Computer Society) The Charted Institute for IT Sri Lanka Section සමඟ නවෝත්පාදන වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙහි මූලික පරමාර්ථය වුයේ COVID) 19, ගංවතුර, සාගත, නියඟ වැනි ඕනෑම ස්වාභාවික විපතක් හඳුනා ගැනීම, වැළැක්වීම, පාලනය කිරීම හෝ සහන සැලසීම සඳහා අවශ්‍ය නවීනතම තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිෂ්පාදන සහ නවෝත්පාදන හඳුනා ගැනීමයි.

මෙහිදී සුදුසුකම් ලත් ඇගයීම් මඩුල්ලක් විසින් පහත දක්වා ඇති ප්‍රධාන කාණ්ඩ 3ක් යටතේ නවෝත්පාදන ඇගයීමට ලක් කරන ලදී.

1 වන කොටස - අධ්‍යයන / අනධ්‍යයන ආයතනවල සිසුන් විසින් වැඩි දියුණු කරන ලද

2 වන කොටස - ඒක පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම් විසින් වැඩි දියුණු කරන ලද

3 වන කොටස - වාණිජ හෝ ලාභ නොලබන ආයතන විසින් වැඩි දියුණු කරන ලද

මෙහිදී ජයග්‍රහණය ලබන නව නිපැයුම්කරුවන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ අන්තර්ජාතික තරඟ වෙනුවෙන් සහභාගී වීමට අවස්ථාව සැලසේ



2.7 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම

පාසල් සිසුන් හා විශ්වවිද්‍යාල මෙන්ම තෘතියික අධ්‍යාපන ආයතනයන් හි සිසුන් අතර නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් නව නිපැයුම් සමාජ ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි. 2020 වසරේ දී නව නිපැයුම් සමාජ 55ක් ස්ථාපිත කර ඇති අතර, ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකාව පුරා නව නිපැයුම් සමාජ 200 ඉක්මවා පිහිටුවා ඇත. වැඩසටහන තුළින් නව නිපැයුම් සමාජ වලට හිමි වන ප්‍රතිලාභ බොහෝ ය.

ඒ අතරින් නව නිපැයුම් සමාජ පවත්වාගෙන යෑමේදී අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා රුපියල් 30,000 දක්වා වූ මූල්‍යමය සහයෝගය, නව නිපැයුම් හා නවෝත්පාදන පිළිබඳව දැනුවත් වීමේ වැඩසටහන් වලට සහභාගී වීමේ අවස්ථාව, බුද්ධිමය දේපළ හිමිකම පිළිබඳ පූර්ණ දැනුවත් වීමේ අවස්ථාව ඒ අතරින් ප්‍රධාන වේ.

විශ්වවිද්‍යාල සිසුන්ගේ උපදේශන දායකත්වයෙන් නව නිපැයුම් සමාජයන් හි ශිෂ්‍ය නව නිපැයුම්කරුවන් හට අවශ්‍ය දැනුම සම්පාදනය සඳහා ද කටයුතු සලස්වනු ලබයි.

නව නිපැයුම් සමාජ ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම වෙනුවෙන් විවිධ පාර්ශවයන්ගේ සහාය

අංකුර නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන හැකියාවන් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා නව නිපැයුම් සමාජ ක්‍රියාකාරිත්වය පුළුල් පරාසයකට ගෙන ඒමට සැලසුම් සකස් කර ඇත.

ඒ අනුව කොමිසමේ මෙහෙයවීම යටතේ විවිධ පාර්ශවකරුවන්ගේ දායකත්වය මෙම කර්තව්‍යය වෙනුවෙන් ලබාගැනීමට පියවර ගෙන ඇත. ඒ අතරින් අධ්‍යාපන අමාත්‍යාංශය සහ නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අතර 2020.08.04 දින අවබෝධතා ගිවිසුමකට එළැඹුණ අතර ඒ හරහා නව නිපැයුම් සමාජ පාසල් පද්ධතිය තුල ප්‍රචලිත කිරීම වේගවත් කිරීමටත්, ඒවා සක්‍රීයව පවත්වා ගනිමින් නිරන්තරව ප්‍රගතීන් විමසීමටත් කටයුතු කරනු ඇත.

මහජන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹීම හරහා පාසල් නව නිපැයුම් සමාජ 200 කට රු 10,000/= බැගින් රුපියල් මිලියන දෙකක මූල්‍යාධාර පහසුකම් ලබාදීමට කටයුතු කරමින් සිටින අතර මේ සඳහා තවදුරටත් විවිධ ආයතන වලින් මූල්‍යමය සහයෝගයන් ලබා ගැනීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

එසේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහාය මෙම වැඩසටහන සඳහා ලබාගැනීම තුළින් විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී කොමිසම මගින් මෙහෙයවන ජාතික තරඟ ජයග්‍රහණ ලබාගත් නව නිපැයුම්කරුවන්ට කඩඉම් ලකුණු ලබාදීමටත්, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නව නිපැයුම් සමාජ ප්‍රචලිත කිරීම වේගවත් කිරීමටත්, ඒවා සක්‍රීයව පවත්වා ගනිමින් නිරන්තරව ප්‍රගතීන් විමසීමටත් කටයුතු කරනු ඇත.



මෙහිදී ස්වාධීන රූපවාහිනිය වෙතින් නව නිපැයුම් සමාජ වැඩසටහන් සඳහා ප්‍රචාරණ පහසුකම් නොමිලේ ලබාගැනීමට කටයුතු කර ඇත.

තව ද මූල්‍යාධාර භාවිතය නිරීක්ෂණය කිරීම සහ නව නිපැයුම් සමාජ වල ප්‍රගතිය විමසීම සඳහා රේඛීය අමාත්‍යාංශයට අනුබද්ධිත ප්‍රාදේශීය නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යනාදී පාර්ශවයන්ගේ සහාය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. මෙහිදී නව නිපැයුම් සමාජ තුලින් බිහිවන නව නිපැයුම්, කොමිසම මඟින් සංවිධානය කරනු ලබන "සහසක් නිපැයුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන තරඟාවලියේදී හඳුනාගැනෙන නව නිපැයුම්, පේටන්ට් සඳහා යොමුවන නව නිපැයුම් යනාදිය පිළිබඳව නිරීක්ෂණයට කටයුතු කරයි.

නව නිපැයුම් සමාජ දිරිගන්වන "නිපැයුමාණි"

නව නිපැයුම් සමාජ තුල නව නිපැයුම් බිහිකිරීම සඳහා අවශ්‍ය නව තාක්ෂණයන් හා දැනුම බෙදාගැනීම සඳහා "Idea Incubator" නමින් පාසල් මට්ටමේ ප්‍රාථමික අදහස් වෙළෙඳපොළ ජයගත හැකි නිර්මාණ බවට පත් කළ හැකි වේදිකාවක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම තුල නිර්මාණය කිරීම සඳහා මූලික සැලසුම් සකස් කර ඇත. රූපගත කිරීමේ පහසුකම් සහිත චිත්‍රාගාරය හරහා දැනුම ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් "නිපැයුමාණි" නමින් හඳුන්වා දී ඇති අතර, නව නිපැයුම්කරුවන්ගේ නව නිර්මාණ සහ විවිධ දැනුම බෙදාගැනීමේ වීඩියෝ සහිත "YOUTUBE" නාලිකාවන් දෙකක් සහ ZOOM වැනි මාර්ගගත ක්‍රමවේදයන් යොදාගනිමින් විවිධ ක්ෂේත්‍රයන් හි දැනුම ප්‍රචලිත කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

නිපැයුමාණි
NIPAYUMAANI நிபயுமாணி
THE NATIONAL INNOVATION PROMOTION PROGRAMME





2.8 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් ගේ නිර්මාණ අයිතීන් සුරකිමින් දේශීය වශයෙන් ලබාදිය හැකි උසස් තත්ත්වයේ තාක්ෂණික දැනුම සහ අදාල සේවාවන් ලබාදීමත්, ඔවුන්ගේ නවෝත්පාදන හැකියාවන් අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වාලමින් බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිතව කළමනාකරණය කිරීමත් වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හැකි උපරිම අයුරින් සහයෝගය ලබාදෙයි. මේ සඳහා අවශ්‍ය දැනුම විධිමත්ව ලබාගැනීම වෙනුවෙන් කොමිසමේ කාර්යමණ්ඩලය ලෝක බුද්ධිමය දේපළ කාර්යාලය හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සහයෝගය මත තාක්ෂණ නවෝත්පාදන සහයෝගීතා මධ්‍යස්ථාන (Technology and Innovation Support Center - TISC) වැඩසටහන යටතේ මනා පුහුණුවක් ලබා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත පසුගිය තෙවසර තුලදී පේටන්ට් අයදුම්පත් 326ක සංඛ්‍යාවක් ලැබී ඇත. 2020 වසර තුල පේටන්ට් අයදුම් කිරීමේ දී නව නිපැයුම්කරුවනට සහාය ලබාදීම පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ.

පේටන්ට් බලපත්‍ර සංරචනය සඳහා සහාය ලබාදුන් සංඛ්‍යාව	- 41
පේටන්ට් අයදුම් කිරීම සඳහා මූල්‍ය සහාය ලබාදුන් සංඛ්‍යාව	- 33
කොමිසම හරහා පේටන්ට් අයදුම් කළ සංඛ්‍යාව	- 38

බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ එය ඉල්ලුම් කිරීමට අදාල මූල්‍යමය සහයෝගය ලබාදීම හරහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වාර්ෂිකව අයදුම් කෙරෙන පේටන්ට් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දැනටමත් සැලසුම් සකස් කර ඇත.

ජාත්‍යන්තර පේටන්ට් සඳහා සහාය ලබාගැනීමේ ක්‍රමවේදය

දේශීය නව නිපැයුම්කරුවන් හට ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ ගාස්තු, පේටන්ට් සහයෝගිතා ගිවිසුම් (PCT) ගාස්තු මෙන්ම නෛතික කටයුතු සඳහා අදාල ගාස්තුව ද ප්‍රතිපූරණය වෙනුවෙන් කොමිසමේ සහයෝගය ලබාදීම සිදු කරයි. එම සේවාව ලබාගැනීම සඳහා නව නිපැයුම්කරු විසින් ගෙවීම් පිළිබඳ සාක්ෂි සහ රටට එමඟින් හිමි වන සමාජ, ආර්ථික, පාරිසරික හා වෙනත් ප්‍රතිලාභයන් පිළිබඳ පිළිගත හැකි ආයෝජන සැලැස්මක් සමඟ ලිඛිත ඉල්ලීමක් කොමිසම වෙත ඉදිරිපත් කළ යුතු ය.





2.9 කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම්

- **"Fight Against COVID -19" - කොරෝනා වසංගතයට එරෙහි නවෝත්පාදන මෙහෙයුම**

ශ්‍රී ලංකාවට ද බලපෑ කොරෝනා ගෝලීය වසංගත තත්ත්වයෙන් වැළකී සිටීමින් ඊට සාර්ථකව මුහුණ දීම සඳහා නවෝත්පාදන තුලින් විසඳුම් සෙවීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් "Fight Against COVID 19" ව්‍යාපෘතිය 2020 මාර්තු මස 20 වන දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී "නවෝත්පාදන අදහස්", "සංකල්ප", "මූලාකෘති", "අවසන් නිෂ්පාදන" සහ "නිර්මාණ සැලසුම්" යනාදිය ප්‍රායෝගික යෙදවුම් බවට පත් කරමින්, එම නිපැයුම් ජනතාවට හඳුන්වා දීම සඳහා කොමිසම පුළුල් මෙහෙවරක නිරතව සිටියි.

මෙම කෙටි කාලය තුල නව නිපැයුම් 364 ක සංඛ්‍යාවක් මෙම ක්‍රියාන්විතය හා සම්බන්ධවී සිටින අතර, ආනයන ගණයේ වෛද්‍ය උපකරණ (උදා: Video Laryngoscope, PPE Kit) අඩු වියදමකින් නිපදවා ගත හැකි දේශීය නිමැවුම් ලෙසින් ඉදිරිපත් කර තිබීම සුවිශේෂී වේ.

මෙම සෑම නව නිපැයුමක්ම බිහි වී ඇත්තේ සාමාන්‍ය සමාජ වටපිටාවක් තුල නොවේ. දුෂ්කරතා රාශියක් මධ්‍යයෙහි නිපැයුම්කරුවන් විසින් අවශ්‍ය මෙවලම් සොයා ගැනීමට දරන ලද වෙහෙස ප්‍රශංසනීය වන අතරම විවිධ වූ බාධක හා පාරිසරික සීමාවන් මධ්‍යයෙහි කොමිසම විසින් සුරක්ෂිත රටක් උදෙසා මෙවන් ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමම දැවැන්ත අභියෝගයක් විය. වර්තමානය වන විට මෙම ව්‍යාපෘතිය මගින් ඉහළ සාර්ථකත්වයක් හිමි වී තිබීම රටක් වශයෙන් ලැබූ සුවිසල් ජයග්‍රහණයකි.



"Fight Against COVID-19" විනිශ්චයට ලක් වූ නිපැයුම්

1	Face Mask made with Natural Herbal Medicine	43	Automatic Water tap by Using Foot Pressure
2	Radiation Active Air Purifying and Advanced Mask Device	44	Portable Hand Sanitizer
3	Microorganism Killing and Filtering Air Conditioner	45	Hand Wearable Sanitizing Liquid Container
4	Air Sealed Intubation Bag	46	Safety Automatic Toothpick Dispenser
5	Protective Ventilation Suite for Healthcare Personnel	47	Machine to Avoid Spreading Viruses such as Corona by ATM Machines, Key Pads and Touchpads
6	Open Source Ventilator Project	48	Heated Safety Dress to use for Medical Treatments
7	Fabrication of ICU Beds for Emergency Situation	49	Sanitizing Equipment
8	Ayurvedic Face Mask	50	Robot to use at the hospital.
9	Syringe Pump	51	Isolation Booth for OPD Doctors and to Perform Mass COVID Testing
10	Nerve Stimulator	52	Fully Mechanical ICU Bed
11	Automated Robot for Hospitals	53	All-In-One Sterilizer for COVID 19
12	Microorganism diverting and clearing device (MDCD)	54	Automated Room Sterilizer for COVID 19
13	Device with Catheter Tube, External Public Bladder Hanger	55	Remote control Sanitizer Machine
14	Video Laryngoscope	56	Heat Room
15	PPE with Cooling System	57	Portable Steamer
16	Ultrasonic disinfectant diffuser	58	Sensored Tap
17	Mechanical Cardio Pulmonary Resuscitator	59	Video Assisted Ward Communication System to Minimize Exposure of Doctors to COVID - 19
18	Patient Inspection Chamber with Remote monitoring	60	Modified Face Mask
19	Easy Ventilator Machine	61	App Provide Elaborate Information
20	Automatic Door Opening System	62	Possible Management of Corona viral infections
21	Advanced Ventilator	63	QR Curfew Pass
22	Detection of COVID-19- Manufactured in Sri Lanka	64	Reusable ultra-violet germicidal irradiating (UVGI) sterilizing facepiece respirator
23	Disinfection Chamber	65	Modified Steaming Unit
24	Disinfection Robot	66	Secure Remote Patient Monitoring System
25	Face Mask	67	Oxygen Flow-Rate Measuring Equipment
26	Negative Pressure Chamber	68	Disinfection Spray Gun System
27	Safety Chamber for Medical Staff	69	Walkthrough Disinfection Corridor
28	Human Safety Beam	70	An Organic Essence Extraction Methodology & Apparatus to Extract Essences from Organic Material
29	Sterilization Chamber for COVID-19	71	Low Flow Fixed Performance Oxygen Delivery System
30	Protective Tap	72	CORONA Protective Tissue Paper
31	Remote Control Patient Side Up Mattress	73	Low Cost Reusable Powered Air Purifying Respirator
32	Prescription Management System for Covid 19	74	Foldable Intubating Chamber
33	Automatic Hand Washer	75	Automatic Non-Contact Sanitizer Machine
34	Horizontal/Vertical Collapsible Low-Cost Helmet	76	Disposable protective nebulization chamber
35	Foot Operated Door Handle	77	Remotely Controlled Robots Equipped with UV Lights to Disinfect Public Places
36	Wilco Mini Germ Killer	78	Covid 19 Diagnosis Measuring Pluggable and Web Platform for Identifying Red Areas
37	Self-Quarantine People Monitoring System	79	Isolation Pod
38	Ventilator Pressure Control System	80	Wireless Stethoscope
39	COVID Bag	81	Steam System
40	COVID Guard	82	Re-Usable Transparent Viricidal Mask (RUTVM)
41	Automatic Hand Sanitizer	83	Air Purifying Equipment
42	Ambu Assisted Mechanical Ventilator	84	Sterilizing Robot





"Fight Against COVID-19" විනිශ්චයට ලක් වූ නිපැයුම්

85 Driver-Less Transporting System
86 Automatic Hand Washing Equipment
87 Soap Petals
88 Easy Shoe Wearing Case for Preventing Virus Spreading
89 Cellbotic
90 Covid -19 Quarantine Monitoring System
91 Disinfection Cubical
92 Low Cost Standard Face Mask
93 Automatic Water Tap
94 Automatic Sanitizing Dispenser
95 PCR Machine
96 Protective Face Shield
97 Hands Free Door Opener
98 Robot for Hospitals
99 Low-Cost Reusable Mobile Sample Collection Chamber
100 Low Cost Multifunction Bed
101 CORONA Preventive Tap
102 Quarantine Tracking System
103 Integrated Thermal Emanation Glass
104 Sanitizing Band (SANIBAND)
105 Modified Drone for COVID 19 Safety Actions
106 Social Distancing Belt when Standing in a Queue or Crowded Place
107 Reliable Proportional Servo Valve for Ventilator Machines
108 Smart Portable Tap Handle Controller
109 Sodium Bicarbonate for IV infusion and Ozone for IV for COVID19
110 Remote Patient Monitoring System
111 COVID 19 Protection Units
112 Patients Monitoring System in Remotely (Central Monitoring System)
113 Specialized Covid-19 Human Ventilator
114 Disinfectant Liquid Spraying Device
115 Sanitizing Chamber Compressor Type
116 Rasam Peya Prevent Plus
117 Paddle Base Hand Sanitizer
118 High Intensity Pulse Light Disinfection
119 Gloves Removing Machine
120 Easy Equipment for Control COVID Spreading
121 ManKiwwa Mobile App
122 Ayurvedic Oral & Throat spray
123 Disinfection Chamber-Killer CORONA
124 Online e-Medical Care System
125 Disinfection Equipment for Applying in Public Transport
126 Medicine Spraying Apparatus
127 Traditional Disinfectant Medicine
128 Heat Generated Automatic Sanitizing Box
129 Fully Automatic Smog Disinfection System
130 Fully Auto Hand Sanitizing Unit
131 External Treatment Method for COVID 19
132 Transport Monitoring System via Mobile App
133 Automatic Any Direction Hand Sanitizing Dispenser
134 Negative Pressure Chamber for Aerosol Generating procedures & Intubation Procedures
135 Disinfectant Pen Holder
136 Triple Active Currency, Hand and Mobile Equipment Sanitizing Machine
137 Ventilator Machine
138 Low Cost UV Sterilizer
139 Automatic Sanitize Machine
140 Domestic Steam Inhaler
141 Transparent Face Cover for Caps
142 AeroVEC
143 Artificial Doctor Software
144 Automatic Hand Sanitizer Spraying Machine
145 Anti COVID -19 VIRUS STEAMER
146 Push Pull Door Handle
147 Modified steamer
148 Liquid Dispenser
149 Corona Safety Sink
150 Preparation of Ayurveda Formula (Shirishavaleha)
151 Ayurvedic Oral & Throat spray
152 Personal Protective Equipment from Scuba Mask
153 Ozone Generator for Disinfect CORONA
154 Bio Safety Cabinet
155 PCR Workstation
156 Sensored Sanitizer and Water Tap
157 Low Cost Paddled Hand Washing Equipment
158 UV Air Purifier
159 KDU VentilatorPro KDU Ver. 1.0
160 Tracelett – Simple technology to promote community driven contact tracing
161 Pneumatically driven, time-cycled ventilator with user determined volume and flow rate selection capability
162 "Ingurukottamalli" Herbal Tea
163 "SAFE HAND" Disinfectant Pen
164 Automated RNA extraction Cubicle
165 Automatic hand cleaning system for prevention of spreading infections
166 Chest Compression Device for Cardiopulmonary Resuscitation
167 Automatic Door Sanitizer





"Fight Against COVID-19" ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ සාරාංශ සටහන

	ඇගයීම් - 01 2020/04/06	ඇගයීම් - 02 2020/04/10	ඇගයීම් - 03 2020/04/16	ඇගයීම් - 04 2020/04/21	ඇගයීම් - 05 2020/04/27	ඇගයීම් - 06 2020/05/04	ඇගයීම් - 07 2020/06/02	ඇගයීම් - 08 2020/07/27	එකතුව
ඇගයීමට ලක් කරන ලද නව නිපැයුම් ගණන	18	7	11	26	16	32	43	19	172
මූල්‍ය /වෙනත් සහයෝගයන් සඳහා තෝරාගන්නා ලද නව නිපැයුම් ගණන	13	6	4	16	6	11	3	10	69
කොමිසම විසින් ලබාදුන්/ලබාදීමට නියමිත මූල්‍යාධාර /ප්‍රධාන වටිනාකම (රු.)	4,350,000.00	1,782,865.00	45,275.00	1,604,500.00	835,000.00	1,874,600.00	1,725,000.00	-	12,217,240.00
උත්පාදනය කිරීමට අපේක්ෂිත ව්‍යවසායකයින් ගණන	10	5	4	13	2	11	3	4	52
පේටන්ට් අයදුම් කිරීම සඳහා සහයෝගය ලබාදීම									35
පර්යේෂණ පහසුකම් සම්පාදනය									22

නව නිපැයුම්කරුවන් හට සිය නිපැයුම් සාර්ථකව වාණිජකරණය කිරීම සඳහා අවස්ථාව සැලසීම වෙනුවෙන් COVID-19 ආශ්‍රිත නව නිපැයුම් ඉලක්ක කර ගනිමින් නව නිපැයුම්කරුවන් හා ආයෝජකයන් සම්බන්ධ කරවීමේ විශේෂිත වැඩසටහන් ද්විත්වයක් ද පැවැත්වීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු කරන ලදී.

- මෙහි පළමු වෑයම වශයෙන් නව නිපැයුම්කරුවන් තිස්දෙනෙකු (30) ගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා ව්‍යවසායක සම්බන්ධීකරණ වැඩසටහන 2020 මැයි මස 06 වන දින ගංඟාරාම විහාරස්ථානයේදී පවත්වන්නට යෙදුණි.
- එම සාර්ථකත්වය හමුවේ එහි දෙවන පියවර 2020 මැයි මස 27 වන දින ගංඟාරාම විහාරස්ථානය පසුබිම් කරමින් පවත්වන ලද අතර, ඒ සඳහා වාණිජකරණ හැකියාවෙන් යුත් නව නිපැයුම් එකසිය විස්සක (120) සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරිණි.
- මෙම වැඩසටහන සඳහා සහාය දැක්වීමට ඉදිරිපත් වූ ආයෝජකයින් පහත පරිදි වේ.
  - ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව
  - කොළඹ වාණිජ මණ්ඩලය
  - වයිට්ලයින් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම
  - එක්සෙල් ට්‍රේඩිං (පුද්ගලික) සමාගම
  - ඇනලිටිකල් ඉන්ස්ට්‍රුමන්ට්ස් (පුද්ගලික) සමාගම
  - ජාතික පී.වී.සී. සමාගම
  - සිංගර් (ශ්‍රී ලංකා)
  - නවලෝක රෝහල් සමාගම
  - ඒ. බවර් සහ සමාගම
  - එන්විෂන් හෝල්ඩිංග්ස් ජාත්‍යන්තර සමාගම
  - RCS 2 Technologies සමාගම
  - සිසිල් සමාගම
  - ජේ. කේ. එස්. සමාගම
  - නිෂූ ඇපරල්ස්
  - කෙයා පොයින්ට්
  - ලංකා රසායන විද්‍යා ආයතනය
  - ලාෆ්ස් (පුද්ගලික) සමාගම
  - කෙන්ට් සමූහ ව්‍යාපාරය
  - සෙලින්කෝ සමාගම
  - ජාතික සංවර්ධන බැංකුව



කොරෝනා වෛරසය මුලිනුපුටා දැමීම වෙනුවෙන් වූ දේශීය මෙහෙයුම තුල සුවිශේෂී වූ ජාතික වගකීමක් දරමින්, සිය පූර්ණ දායකත්වය ලබාදීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු කර ඇත.

➢ වන ජීවී හා මානව ගැටීම් අවම කරලීමේ ව්‍යාපෘතිය - "අලි වැට"

වර්තමානයේ සුලභ ගැටළුවක් බවට පත්ව ඇති වන සතුන් හා මානව ක්‍රියාකාරකම් ආශ්‍රිත ගැටළු සඳහා ස්ථිරසාර විසඳුම් සම්පාදනය කිරීමේ අභිප්‍රාය ඇතිව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් නවතම වැඩසටහන් ආරම්භ කර තිබේ. මෙමඟින් සතුන් හා මිනිසුන් යන දෙකොට්ඨාශයෙහිම ආරක්ෂාව තහවුරු වීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව පළමු අදියර වශයෙන් අලි-මිනිස් ගැටුම සඳහා "අලි වැට" වෙනුවෙන් නවෝත්පාදන විසඳුම් ක්‍රියාවෙහි යෙදවීමට කොමිසම විසින් කටයුතු කර ඇත. විෂයයට අදාලව නවෝත්පාදන විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා විවෘත ආරාධනයක් කරන ලද අතර, එමඟින් හඳුනාගත් යෝග්‍ය තත්ත්වයේ නව නිපැයුම් කිහිපයක් මේ වන විට ප්‍රායෝගික භාවිතය සඳහා යොදවා ඇත.

රේඛීය අමාත්‍යාංශයේ අනුදැනුම මත වනජීවී දෙපාර්තමේන්තුවේ සහයෝගය ද ඇතිව නව නිපැයුම් 07කට වැඩි ප්‍රමාණයක් විසඳුම් පොකුරක් ලෙස වාණිජකරණය කර, සමාජගත කිරීමේ මෙහෙවරෙහි පළමු අදියර ලෙස තෝරාගත් ප්‍රදේශ 03ක් ඉලක්ක කර ගනිමින් වටප්‍රමාණ කි.මී. 07කට වැඩි ප්‍රමාණයක් ආවරණය කරමින් නියමු ව්‍යාපෘති 03ක් මේ වන විට සාර්ථකව අවසන් කරමින් සිටී. උඩවලව ග්‍රාමයෙහි කි.මී. 01ක්, මහඔට්ටපල්ලම කි.මී. 01ක් සහ නීලබැම්ම ග්‍රාමයේ කි.මී. 2ක් වශයෙන් මේ වන විට "අලි වැට" සකස් කර ඇත.





➢ මහවැලි කලාපයටත් නවොත්පාදන විසඳුම්

මහවැලි කලාපයන් තුල පවතින විදුලි වැට දේශීය නව නිපැයුම් මඟින් බලගැන්වීමේ අවස්ථාව ප්‍රථම වරට 2020 වර්ෂයේදී දේශීය නව නිපැයුම්කරුවන්ට හිමි විය. "නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්" උදෑතය සමඟින් දේශීය නව නිපැයුම් තුලින් ශ්‍රී ලංකාව බලගන්වන අරමුණ පෙරදැරිව කොමිසම විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. 2020 වර්ෂය තුල කොමිසම ලද සුවිසල් ජයග්‍රහණයක් ලෙස මෙය හැඳින්විය හැකි අතර 2021 වර්ෂයේ පටන් දේශීය නව නිපැයුම් තුලින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත.

මෙම වැඩසටහන සඳහා කොමිසම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර එකඟතා ගිවිසුමක් 2020 වර්ෂයේදී අත්සන් කරන ලද අතර එමඟින් මූලික අදියරේ දී මහවැලි බී කලාපයේ පවතින විදුලි වැට දේශීය නව නිපැයුම් මඟින් බලගන්වන්නට දෙපාර්ශවය විසින්ම එකඟත්වයට පැමිණුනි.

මහවැලි කලාපයන් තුල වනජීවීන් සහ මිනිසුන් අතර ඇතිවන ගැටුම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක මෙම වැඩසටහන තුලින් මහවැලි කලාප තුල ජනයාගේ දිවි පෙවෙත යහපත් කිරීම සහ වනජීවීන් සඳහා සුරක්ෂිත වට පිටාවක් ගොඩනගන අතරතුර දේශීය නව නිපැයුම් වාණිජකරණය කිරීම ප්‍රධානතම අරමුණකි.

තවද වනජීවීන් මඟින් සිදුවන වගා හානි ඇතුලු දේපළ හානි හේතුවෙන් දේශීය ආර්ථිකයට සෘජු සහ වක්‍රාකාරයෙන් අහිමි වන සම්පත් ප්‍රමාණය අවම කිරීම මෙහි තවත් එක් අරමුණකි.

මෙම ව්‍යාපෘතිය තුලින් නව නිපැයුම් වානිජකරණයෙන් නව නිපැයුම්කරුවන් වෙත හිමිවන ලාභය මත පදනම්ව කොමිසම වෙත නිෂ්පාදන භාගයක් ලබාගැනීමට නියමිතය.



➢ වන ජීවීන් සුරකිමින් දුම්රිය මාර්ග අනතුරු වළක්වාලන ව්‍යාපෘතිය

වන ජීවීන්ට දුම්රිය මාර්ග හේතුවෙන් ඇති වන අනතුරු වළක්වාලීමත්, එමඟින් වනාශ්‍රිත ප්‍රදේශයන් හි දුම්රිය ධාවනයට ඇති වන බලපෑම් අවම කිරීමත් වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියාත්මක කරන වැඩසටහනකි. විශේෂයෙන් වන අලින් වැඩි වශයෙන් දුම්රිය අනතුරු වලට ලක් වන මහව - මඩකලපුව දුම්රිය මාර්ගය ප්‍රධාන කර ගනිමින්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති ස්ථාන කිහිපයක් ඉල්ලකර ගනිමින් මෙම පර්යේෂණයන් කිරීමට නියමිත ය. මෙය ද වර්තමානයේ බහුලව දක්නට ඇති ගැටළුවක් සඳහා සාර්ථක නවෝත්පාදන විසඳුම් ලබාදෙන වැඩසටහනක් ලෙස සැලකිය හැකි ය.

● "කෘෂිකර්ම" හා "ආහාර" තාක්ෂණයන් ඉලක්ක කර ගත් විශේෂ වැඩසටහන

රටේ ජීවත් වන ජනතාවගේ මූලික අවශ්‍යතා සඳහා නවෝත්පාදන විසඳුම් ලබාදීම මත පදනම් වෙමින්, "කෘෂිකර්ම" හා "ආහාර" තාක්ෂණයන්ට අයත් නව නිපැයුම් ප්‍රචලිත කිරීම සඳහා විශේෂිත වැඩසටහනක් 2020 ජූලි මස 01 වන දින කොළඹ 02 ගංඟාරාම විහාරස්ථානයේ දී පූජ්‍ය ආචාර්ය කිරිබත්ගොඩ අස්සජි හිමියන්ගේ ආශීර්වාදයෙන් පවත්වන ලදී.



මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වුයේ නිපැයුම්කරුවා සහ ආයෝජකයා යන දෙපාර්ශවයම සම්මුඛ කිරීම ඔස්සේ නව නිපැයුම් වාණිජකරණය සඳහා යොමු කරවීමයි.

රටෙහි පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන්, දිවයිනේ සිව්දෙස විහිදී සිටින "කෘෂිකර්ම" හා "ආහාර" තාක්ෂණයන්ට අයත් නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇගයීමට ලක් කළ අතර මූලිකව තෝරාගත් නිපැයුම් 120ක් මෙම වැඩසටහනට තෝරා ගන්නා ලදී.

තව ද කොමිසම විසින් මෙම හමුවට ආයෝජකයින් 60 කට අධික ප්‍රමාණයක් සම්බන්ධ කරගත් අතර එහිදී තෝරාගත් නිපැයුම්කරුවන්ට ඔවුන්ගේ නිපැයුම් වාණිජකරණයට අවස්ථාව සලසා දෙන ලදී.










with Automated Cylinder and
to get Coconut Fiber
ne tie fiber from coconut husks, by
ses in automated hinges, and send-
two rotating nail wheels and again
r side through rotating nail wheels.

• “Tea Talk” - ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය යනු දේශීය ආර්ථිකයට සෘජු දායකත්වයක් දක්වන ඵලදායී මාර්ගයකි. කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය දේශීය ආර්ථිකය නගාසිටුවන අතරම, ඒ ආශ්‍රිතව ඇති වන පසුබැසීම ආර්ථිකයේ කඩාවැටීමට හේතුවේ. ඒ අනුව කර්මාන්ත ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් ඵලදායී නවෝත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව, එහි ප්‍රථම අදියර වශයෙන් දේශීය ආර්ථිකයේ සුවිශේෂී ස්ථානයක් හිමිව තිබූ තේ කර්මාන්තය වෙත බලපා ඇති ගැටළු ඉලක්ක කර ගනිමින් “Tea Talk” නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කොමිසම විසින් සැලසුම් සකස් කර ඇත. තේ කර්මාන්තයේ ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් ලබාදෙන අතරතුර, එම නවෝත්පාදන විසඳුම් නිපැයුම් වශයෙන් වෙළෙඳ පොළ වෙත යොමු කිරීමට පියවර ගනු ලැබේ. “Tea Talk” හි සහයෝගීතා අනුග්‍රහය ස්වාධීන රූපවාහිනී සේවය විසින් උසුලන අතර, වැඩසටහන් මාලාවක් ලෙස විකාශය කිරීමට නියමිත ය. එමෙන්ම තේ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සත්කාරක දායකත්වය ද මේ සඳහා හිමි වී ඇත.



“Tea Talk” ප්‍රථම අදියර වශයෙන් ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ මැදිහත් වීමෙන් කර්මාන්තයට බලපාන තාක්ෂණික ගැටළු හඳුනා ගන්නා අතර, අනතුරුව මෙම ගැටළු සඳහා නව නිපැයුම්කරුවන් වෙතින් නවෝත්පාදන විසඳුම් ලබාගැනීමට කටයුතු කරයි. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ගේ මැදිහත්වීමෙන් එම නවෝත්පාදන විසඳුම් විනිශ්චය කෙරෙන අතර, කොමිසමේ දායකත්වය මත නිපැයුම් වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කටයුතු කරනු ලබයි. ඉන් අනතුරුව විධිමත්ව වැඩිදියුණු කරන ලද නව නිපැයුම් කොමිසමේ මඟ පෙන්වීම හා ආයෝජකයන් ගේ ද මැදිහත්වීම මත වාණිජකරණ ක්‍රියාන්විතය සඳහා යොමු කිරීමට නියමිත ය.



- **පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසර පරිසර හිතකාමී විදුලි උත්පාදන ක්‍රමවේදය**

පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසර පරිසර හිතකාමී විදුලි උත්පාදන හා බලශක්ති අර්බුදයට නව නිපැයුම් තුලින් විසඳුම් සෙවීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් මූලාරම්භය ගෙන තිබේ. මේ සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ද, ශ්‍රී ලංකා නාවික හමුදාව, විශ්වවිද්‍යාල මෙන්ම දේශීය නවෝත්පාදකයන් ගේ දායකත්වය ද හිමි වී තිබේ.

වර්තමානයේ රටෙහි විදුලි අවශ්‍යතාවය ගිගා වොට් පැය 37.7 ක් වන අතර, එයින් 82% ක ප්‍රමාණයක් ලැබෙනුයේ පුනර්ජනනීය නොවන මූලාශ්‍රයන් වෙතිනි. පොසිල ඉන්ධන දහනය ගෝලීය උණුසුම තීව්‍ර කිරීමට හේතු වන අතරම මේවායෙහි ස්වභාවිකව පවත්නා සීමිත බව හේතුවෙන් මිල ද දිනෙන් දින ඉහළ යමින් පවතී. එබැවින් මෙම යෝජිත විදුලි උත්පාදන ක්‍රමවේදය ආකාර කිහිපයකින් රටට වාසි සහගත වේ. මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වියදම අවම වන අතර, විදුලි උත්පාදනය සඳහා වැය වන මුදල ද අවම වේ. එමෙන්ම වෙනත් බලාගාරවල මෙන් මහා පරිමාණ වේලි වැනි ඉදිකිරීම් නොමැති වීම ද වාසි සහගත ය. නිදසුනක් වශයෙන් මුහුදු රළෙහි විභව ශක්තිය වායු ප්‍රවාහයකට පරිවර්තනය කරමින් ඒ හරහා ටර්බයින භ්‍රමණය කරවීමේ වඩාත් කාර්යක්ෂම බලශක්ති උත්පාදන ක්‍රමවේදයක් භාවිතා කිරීම සිදුවේ. එබැවින් මෙම යෝජිත ව්‍යාපෘතිය වඩා කාර්යක්ෂම, විශ්වාසනීය, තිරසර මෙන්ම පරිසර හිතකාමී බලශක්ති උත්පාදන ක්‍රියාවලියක් වනු ඇත.

මෙහිදී මූලික වශයෙන් නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ව්‍යාපෘති විද්වත් මණ්ඩලයක් මඟින් ඇගයීමට ලක් කොට තෝරාගත් නව නිපැයුම් වල මූලාකෘති නිර්මාණය කිරීමට සහයෝගය ලබා දීම කොමිසමේ අපේක්ෂාවයි.



2.10 පර්යේෂණයන් එළිදැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සමුළුව - "From Innovation to Impact -FITI"

දේශීය නව නිපැයුම් ප්‍රචලිත වීම සඳහා නිර්මාණශීලීත්වය නිවැරදිව සමාජගත විය යුතු ය. ඒ සඳහා නව නිපැයුම්කරුවන්ගේ නව අදහස්, නව පර්යේෂණ නව නිපැයුම්කරුවාට සීමා නොවී ජාත්‍යන්තරය දක්වා ව්‍යාප්ත විය යුතු ය. ඒ අනුව, නවෝත්පාදකයන් හට සිය පර්යේෂණයන් එළිදැක්වීම, නව නිපැයුම් පිළිබඳව හැදෑරීම මෙන්ම තම පර්යේෂණ අවශ්‍යතා සඳහා මාර්ගෝපදේශකත්වය ලබාගැනීම වෙනුවෙන් "From Innovation to Impact (FITI)" නමින් සුවිශේෂී ජාත්‍යන්තර සමුළුවක් ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට 2019 වසරේ දී පවත්වන ලදී. මෙය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (Sri Lanka Association for the Advancement of Science - SLAAS) එක්ව සංවිධානය කරන්නකි. FITI සමුළුව 2020 වසරේ දෙසැම්බර් 08 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී දෙවන වරට සාර්ථකව පවත්වන ලදී.

තව ද ලොව පිළිගත් විශාලතම "IEEE" නම් " Scoupus Indexed" ජර්නලයෙහි පර්යේෂණ ලිපි පළ කිරීමේ අවස්ථාව ලැබෙන අතර, පර්යේෂකයන් සඳහා එය ඉතා වැදගත් අවස්ථාවකි.

මෙහිදී පර්යේෂණ ලිපි 36 ක් එළි දක්වන ලද අතර, පර්යේෂණ හා සංවර්ධන නවෝත්පාදනවල සමාජීය බලපෑම සහ සමාජ නවෝත්පාදනයේ සමාජීය බලපෑම යන ප්‍රධාන මාතෘකාවන් යටතේ සිය පර්යේෂණ ලිපි ඉදිරිපත් කිරීම සඳහා අදාල නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසුනි. ප්‍රවීණ දේශීය සහ විදේශීය ඇගයීම් මඩුල්ලක් මගින් විනිශ්චය කටයුතු සිදු කරන ලදී.

මෙහි ප්‍රධාන කථිකයා ලෙසින් තොරතුරු, සිවිල් ඉංජිනේරු, කළමනාකරණ හා ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය Arturas Kaklauskas හා මහාචාර්ය Vilnius Gediminas යන විද්වතුන් ලිතුවේනියානු විශ්වවිද්‍යාලයෙන් සම්බන්ධ විය.





2.11 දේශීය නවෝත්පාදකයන් දිරිගැන්වීම සඳහා වූ ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශන සහභාගීත්වය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් ගේ දක්ෂතා ජාත්‍යන්තරය වෙත ගෙන යෑම සඳහා සුවිශේෂී මඟපෙන්වීමක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතින් ලබාදෙයි. කොමිසම මඟින් සංවිධානය කරනු ලබන නව නිපැයුම් තරඟ ජයග්‍රාහකයන් වෙනුවෙන් කොමිසමේ නිර්ණායකයන්ට අනුගතව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අන්තර්ජාතික නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දෙනු ලබයි.

මෙම තරඟ සඳහා සහභාගී වීම තුලින් දේශීය නව නිපැයුම්කරුවන්ට සිය නිපැයුම් වෙනුවෙන් විදෙස් වෙළෙඳ පොළ වෙත ප්‍රවේශ වීමට ද හැකියාව ලැබී ඇත. එමෙන්ම අන්තර්ජාතිකව ලබාගන්නා ජයග්‍රහණ මත සිය නව නිපැයුම් සඳහා දේශීය වෙළෙඳ පොළ තුල වැඩි ඉඩකඩක් නිර්මාණය කර ගැනීමට ද අවස්ථාව සැලසීම විශේෂත්වයකි.

තව ද නවතම සංකල්ප හඳුනාගැනීමට අවස්ථාව සැලසීම, විවිධ තාක්ෂණයන් නව නිපැයුම හා අදාල කරගන්නා ආකාරය හඳුනාගැනීම, විවිධ රටවල නව නිපැයුම්කරුවන් සමඟ අදහස්, දැනුම යනාදිය හුවමාරු කරගැනීමට හැකිවීම, විවිධ රටවල සංස්කෘතීන් අධ්‍යයනයට අවස්ථාවක් හිමිවීම, සන්නිවේදන කුසලතාවයන් වැඩිදියුණු වීම යනාදී ප්‍රතිලාභයන් ද නව නිපැයුම්කරුවන්ට හිමි වේ. රටක් වශයෙන් ගත් කළ දේශීය තරඟකරුවන් ලබන ජයග්‍රහණ හේතුවෙන් අන්තර්ජාතිකව රටට ඇති වන කීර්තිය ද වැදගත් කොට සැලකිය යුතු ය.

මෙම වසර තුල උද්ගත වූ "කොවිඩ්-19" වසංගත තත්ත්වය හමුවේ භෞතිකව ශ්‍රී ලංකාවෙන් බැහැර තරඟ සඳහා අවස්ථාවක් නොමැති නමුදු මාර්ගගත (online) තරඟ සඳහා ඔවුන් යොමු කරවීමට කටයුතු කරන ලද අතර, එමඟින් පහත පරිදි ජයග්‍රහණ හිමි කර ගැනීමට ඔවුන් සමත් වී ඇත.

ප්‍රදර්ශනයේ නම	5th International Invention and Innovation Competition in Canada
පැවති රට	කැනඩාව

නව නිපැයුම	ජයග්‍රහණය
A new method of increasing the speed of movement of the human sperm	රන් සම්මාන
Fire prevention plug base	රන් සම්මාන
Low-cost L.E.D panel lighting system	රිදී සම්මාන
Automatic Garbage Segregation Bin	රිදී සම්මාන
Walking charger	රිදී සම්මාන
Braille, auditory and kinetic reading tool for children with visual impairments (brak)	රිදී සම්මාන
Environment Friendly Horticultural Plugs	රන් සම්මාන
Multipurpose Hybrid Solar Dryer	රිදී සම්මාන
Horizontal/vertical collapsible low-cost face shield	රන් සම්මාන
Safety automated toothpick dispenser	රිදී සම්මාන
Non-Invasive Screening Tool to Detect Anemia	රන් සම්මාන
Mosquito repellent, antiseptic, healthy and natural air-freshener mainly with Ceylon Cinnamon oil or waste water in manufacturing cinnamon oil (prohibited to dump in environment by law), water, emulsifier, alcohol and menthol	රන් සම්මාන
Distant ent examiner	රිදී සම්මාන
All in one sterilizer	රන් සම්මාන
Automated room sterilizer	රිදී සම්මාන
Paste to treat for skin diseases	රන් සම්මාන
“Vision Handy capped Read Currency”	රන් සම්මාන
“Disabled Abled”	රිදී සම්මාන
Formulation of healthy herbal valued nutritional biscuit incorporating turmeric as main ingredient	රිදී සම්මාන
Anti-COVID-19 virus killer steamer	රන් සම්මාන
Anti-COVID-19 virus safety glasses	රිදී සම්මාන
Personal water filter	රිදී සම්මාන
A process to produce growing medium based on spent tea leaves and coco peat mixture	රිදී සම්මාන
High scalable Emergency Ventilator with Pressure and BPM feedback	රන් සම්මාන



කොමිසම වෙත ලැබී ඇති අන්තර්ජාතික පිළිගැනීම

නව නිපැයුම් හා නවෝත්පාදන හා සම්බන්ධ ප්‍රධාන අන්තර්ජාතික ආයතන දෙකක සාමාජිකත්වය ලබා ගැනීම මඟින් නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගෙන ඇත.

අන්තර්ජාතික නව නිපැයුම්කරුවන්ගේ සංවිධානය (IFIA)

ලෝක නව නිපැයුම් සහ බුද්ධිමය දේපල සංවිධානය (WIIPA)

මෙම සාමාජිකත්වය ලබා ගැනීම තුලින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට යොවුන්, විවෘත, කාන්තා යනාදී වූ විවිධ කාණ්ඩයන්ගේ ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ රැසකට සහභාගී වීමේ දුර්ලභ අවස්ථාව ලබා ගැනීමට හැකි වී ඇත. මෙම සංවිධාන මඟින් සිදු කරන සේවාවන් ලෙස පුහුණු වැඩසටහන්, නව නිපැයුම් වාණිජකරණය, බුද්ධිමය දේපල අයිතිය සුරැකීම, පරිසර හිතකාමී නව නිපැයුම් ප්‍රවර්ධනය සහ නව නිපැයුම් සඳහා ප්‍රචාරණය ලබාදීම සඳහන් කළ හැකි ය. ඔවුන් තවදුරටත් වෙබ් අඩවි හරහා ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධ නවතම තොරතුරු ප්‍රචාරණය, නව නිපැයුම්කරුවන්ගේ ව්‍යාපෘති / නව නිපැයුම් සඳහා වෙබ් අඩවි සහ සඟරා මඟින් ප්‍රචාරණය ලබාදීම, පදක්කම් හා ත්‍යාග මුදල් නව නිපැයුම්කරුවන් සඳහා ප්‍රදානය කිරීම ද කරනු ලබයි.

විවිධ තරඟ සඳහා ගුවන් ටිකට්පත්, නවාතැන් පහසුකම් වෙනුවෙන් අනුග්‍රහ දැක්වීම මෙන්ම නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා ලියාපදිංචිය, ප්‍රදර්ශන කුටි සැපයීම හා ප්‍රවාහන පහසුකම් සම්පාදනය යනාදී කටයුතු වල දී සහනශීලීව කටයුතු කිරීම මඟින් ද සහයෝගය ලබාදෙයි. මෙම දිරිගැන්වීම් සහ පිළිගැනීම් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට ඔවුන් ගේ නව නිපැයුම් දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ වාණිජකරණය කිරීම සඳහා වන මහඟු අත්වැලක් වේ.

ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ සඳහා ජූරිය ලෙස සහභාගී වීම

නව නිපැයුම්කරුවන් සඳහා වන අන්තර්ජාතික සම්මේලනය (International Federation of Inventors' Associations-IFIA) විසින් COVID-19 ගෝලීය වසංගතය පිටුදැකීම වෙනුවෙන් නවෝත්පාදන විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා "Inventions Vs Corona" නමැති වැඩසටහන ඔස්සේ නව නිපැයුම්කරුවන්ට අවස්ථා සලසා දුන් අතර, එම ඇගයීම් කටයුතු 2020 මැයි මස 15 දින සිට ජූනි මස 15 දින දක්වා මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. මෙහිදී ජූරි සාමාජිකයෙක් ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ අවස්ථාව නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී නලින් දොලවත්ත මහතාට හිමි වූ අතර, එය ද රටක් වශයෙන් අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

2.12 නවෝත්පාදන සමාජගත කිරීමේ පළාත් වැඩසටහන්

ශ්‍රී ලාංකිකයන් තුළ නව නිපැයුම් හා නවෝත්පාදනයන් පිළිබඳ ආකර්ෂණයක් හා පෙළඹවීමක් ඇති කිරීම වෙනුවෙන් දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කොමිසම කටයුතු කරනු ලබයි. මෙහිදී විශේෂයෙන් ඉලක්ක කර ගනු ලබන්නේ පාසල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන සිසුන්, සාමාන්‍ය වශයෙන් නව නිපැයුම්කරණයෙහි නියැලෙන්නන්, වාණිජකරණ මට්ටමේ නවෝත්පාදකයින් හා විෂයය කෙරෙහි කැමැත්තක් දක්වන පොදු මහජනතාව යි. ඒ අනුව මෙම වසරේ දී පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව 14කි.



2.13 නව නිපැයුම්කරුවන් දැනුවත් කිරීම සඳහා සජීවී වැඩසටහන්

නව නිපැයුම් වාණිජකරණ ක්‍රියාවලිය තුල ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතින් සහාය අපේක්ෂා කිරීමේ දී නව නිපැයුම්කරුවන් විසින් නිසි ක්‍රමවේදය අනුගමනය කිරීම තුලින් ඔවුන් වෙත කඩිනම් ප්‍රතිචාර ලබාගැනීමට හැකි වන අතර, ක්‍රමවේදය නිවැරදි නොවීම තුල ප්‍රතිචාර සඳහා වැඩි කාලයක් ගත කිරීමට සිදුවේ. එලෙස අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රමවේදය පිළිබඳව පැහැදිලි කරමින් ඔවුන් දැනුවත් කිරීම සඳහා විශේෂිත වැඩමුළුවක් 2020 අගෝස්තු 28 කොමිසම පරිශ්‍රයේ දී පැවැත්වුණි. මෙහි විශේෂත්වය වූයේ නව නිපැයුම්කරුවන්ට වැඩසටහන සඳහා පැමිණ සම්බන්ධවීම හැරුණුකොට කොමිසමේ ෆේස්බුක් පිටුව හරහා ද සජීවීව සම්බන්ධවීමට අවස්ථාව සැලසීමයි.

එමෙන්ම පේටන්ට් සංරචනය පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් 2020 සැප්තැම්බර් මස 30 දින කොමිසම පරිශ්‍රයේ දී පවත් වන ලදී. මෙම වැඩසටහන සඳහා ද සජීවීව මාර්ගගතව සම්බන්ධවීමේ අවස්ථාව සලසා තිබීම විශේෂත්වයකි. රට තුල වර්තමානයේ පවත්නා සෞඛ්‍යමය තත්ත්වය සලකමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් දේශීය නවෝත්පාදනයන් ඉලක්ක කරමින් නිර්මාණය කරන ලද මෙම වැඩසටහන් ද්විත්වයම අතිශයින් ඵලදායී විය.

2.14 නව නිපැයුම් ප්‍රචලිත කිරීම

“Sri Lanka Inventors” - YouTube ප්‍රවේශය

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලඟා කර දීමත්, දෙස් විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම සඳහා අලුතින් ක්‍රියාත්මක කළ වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබාගැනීමටත් මෙම චැනලය හරහා අවකාශ සලසා දී තිබේ.



නිල වෙබ් අඩවිය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නිල වෙබ් අඩවිය ප්‍රයෝජනවත් නව මුහුණුවරකින් යුතුව සංස්කරණය කර ඇත. මෙහිදී නව නිපැයුම්කරුවන්, ආයෝජකයන් මෙන්ම නවෝත්පාදනයට හිතැති ශ්‍රී ලාංකික ප්‍රජාවගේ වැඩිමනත් ප්‍රයෝජනය උදෙසා පුළුල් සේවාවක් සැපයීම වෙනුවෙන් එය නිර්මාණය කර ඇත.

කර්මාන්ත ක්ෂේත්‍රය පසුබිම් වූ ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් සොයන්නන් වෙනුවෙන් කොමිසමේ සම්බන්ධීකරණය හරහා නව නිපැයුම්කරුවන් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව ද මෙම වෙබ් අඩවිය සතු වීම සුවිශේෂී වේ.



මොරටුව විශ්වවිද්‍යාලයේ IEEE EMBS Student Branch Chapter සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මොරටුව විශ්වවිද්‍යාලයේ IEEE Engineering in Medicine and Biology Student Branch Chapter මඟින් සංවිධානය කරනු ලබන ISC 2021 සමුළුව සඳහා උපායමාර්ගික සහකරුවෙකු ලෙස අත්වැල් බැඳ ගනිමින් ශ්‍රී ලංකාව තුල පෙව, වෛද්‍ය, ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ නව නිපැයුම් උත්පාදනය සහ ප්‍රචලිත කිරීම සඳහා දායකත්වය සපයනු ලබයි.

මෙමඟින් වෛද්‍ය රූප සැකසුම්, පෙව සංඥා සැකසුම් සහ පෙව යාන්ත්‍රික විද්‍යාවට අදාල නව නිපැයුම් හඳුන්වා දීම සහ නව පර්යේෂණ එළිදැක්වීම සිදු කරන ලදී. තව ද පවතින COVID-19 වසංගත තත්ත්වය මැඩපැවැත්වීමට අදාළව ද නව නිපැයුම් සහ පර්යේෂණ මෙමඟින් එළි දක්වන ලදී.



මාධ්‍ය මෙහෙවර

ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීම උදෙසා දේශීය නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එබැවින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සෑම විටම මාධ්‍ය (විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය) සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර, නවෝත්පාදනය ප්‍රචලිත කිරීම සඳහා ස්වේච්ඡා සහයෝගය මාධ්‍ය වෙතින් ලබාගැනීමට ක්‍රියා කරයි.

නව නිපැයුම් හා නවෝත්පාදනයන් පිළිබඳ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා කොමිසම විසින් කිසිදු ප්‍රචාරණ වියදමක් නොදරා මාධ්‍ය භාවිතයෙන් ක්‍රියාවට නංවා ඇති වැඩසටහන් බොහොමයක් ඇති අතර, පහත දැක්වෙන්නේ ඊට උදාහරණ කිහිපයකි.

- **නව නිපැයුම්කරුවන් හා ආයෝජකයන් ගේ හමුව**

නව නිපැයුම්කරුවන් හා ආයෝජකයන් සම්බන්ධ කෙරෙන (Inventor-Investor Linkage - IIL) වැඩසටහන් මාලාවක් "1 මගේ රට" නමින් කොමිසම විසින් ස්වාධීන රූපවාහිනියේ පූර්ණ අනුග්‍රහය මත විකාශය කරන ලදී.





➢ **City Fm - "නවෝත්පාදන දැක්ම" වැඩසටහන (Innovation Outlook)**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ දායකත්වය ඇතිව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ City Fm නාලිකාව ඔස්සේ විකාශය කෙරෙන "නවෝත්පාදන දැක්ම" (Innovation Outlook) වැඩසටහන සෑම සතියේ දිනකම උදෑසන 7 ට විකාශය කරනු ලබයි. නව නිපැයුම්කරුවන් 28 දෙනෙකු සමඟින් වැඩසටහන් 18ක් මේ දක්වා විකාශය කර ඇත.

➢ **"THE CHALLENGE" - රැල්ලක් නොවී කැරැල්ලක් වන නව නිපැයුම්**

නව නිපැයුම් කිහිපයක් ප්‍රචාරණය සඳහා දෙරණ රූපවාහිනියේ පූර්ණ අනුග්‍රහය හිමි වුණි.





➢ **සිරස "ගම්මැද්ද"ටත් නව නිපැයුම්**

සිරස "ගම්මැද්ද" වැඩසටහන සමඟ එක්ව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් නොච්චියාගම තක්ෂිලා විද්‍යාලයේ දී නවෝත්පාදන වැඩසටහනක් පවත්වන ලදී.





➢ **දෙරණ "START UP 2021"**

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත නව නිපැයුම් තුලින් නව ව්‍යවසායකයන් බිහිකිරීමෙහි ලා ප්‍රයත්නයක් ලෙස දෙරණ නාලිකාව ප්‍රමුඛව ආරම්භ කර ඇති "START UP 2021" වැඩසටහනෙහි උපායමාර්ගික සහකරුවෙකු ලෙස සහයෝගීතා ගිවිසුමක් තුලින් කොමිසම ඒ සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. 2020 වසර තුලදී එහි ඇගයීම් කටයුතු ආරම්භ කරන ලදී.

“START UP 2021” යනු ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායකයින්ට උපදේශනය හා සංවර්ධනය කිරීම සඳහා වූ රියැලිටි වැඩසටහනකි. මෙහිදී ඔවුනට විශේෂ ව්‍යාපාරික උපදේශකයෙකුගේ සහාය ලබාගැනීමට අවස්ථාව හිමිවන අතර, නිෂ්පාදනය වාණිජමය වශයෙන් නව්‍යකරණයට ලක් කිරීම, ව්‍යාපාර බුද්ධිය, දැනුම, පළපුරුද්ද සහ කුසලතා ලබා ගැනීමට ද අවස්ථාව සැලසේ. ජයග්‍රාහකයින්ට ඔවුන් ගේ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රදානයන් ද හිමි වේ.



- **කොමිසමේ වෑයම උදෙසා සවියක් වූ මුද්‍රිත මාධ්‍ය සහයෝගය**

නව නිපැයුම් සමාජගත කරමින්, ඒවායේ වැදගත්කම ඉස්මතු කරවීම සඳහා මුද්‍රිත මාධ්‍යයන්ගේ පූර්ණ අනුග්‍රහය හිමි විය.

2.15 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් විසින් ඉටු කරන්නා වූ මෙහෙවර හා දේශීය ආර්ථිකය වෙනුවෙන් ලබාදෙන්නා වූ දායකත්වය ඇගයීම සඳහා සෑම වසරකම ඔක්තෝබර් මස 26 වන දින ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් සම්මත වී ඇත. ශ්‍රේෂ්ඨ ඉංජිනේරුවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධූරය හෙබවූ දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමන් විසින් ඉටු කළ අපරිමිත සේවාව ඇගයීම උදෙසා එතුමන් ගේ ජන්ම දිනය පාදක කර ගනිමින් මෙම දිනය ප්‍රකාශයට පත් කර තිබේ.

ඒ අනුව, මෙම සුවිශේෂී දිනය නිමිති කොටගෙන ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ගේ නව නිර්මාණ දායකත්වයෙන් නිමැවුණු නවතම අලිවැට ද්විත්වයක්, වන අලි තර්ජනයට දැඩිලෙස මුහුණ දෙන කරුවලගස්වැව ප්‍රදේශයේ ජනතාව වෙත ලබාදීමට හැකිවීම නව නිපැයුම්කරුවන් ප්‍රමුඛ කොමිසම ලද මහත් භාග්‍යයකි.

2.16 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් උපරිම සේවාවක් සැලසීම වෙනුවෙන් සුවිසල් මෙහෙවරක නිරත වන ආයතනයකි. නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලබා දෙන එම සේවාව ගුණාත්මක හා කාර්යක්ෂමතාවයෙන් ඉහළ සේවාවක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ඉහළ නැංවීමද අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, ඔවුන් විෂයානුබද්ධව විවිධ පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත.

පහත දැක්වෙන්නේ 2020 වසර තුළ කාර්ය මණ්ඩල නිපුණතා වෙනුවෙන් සහභාගීත්වය ලබා දුන් වැඩසටහන් පිළිබඳ තොරතුරු ය.

- මනෝවිද්‍යාව සහ උපක්‍රමික අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් නොමිලේ පවත්වන ලද ධනාත්මක චින්තනය හා සේවක අභිප්‍රේරණ වැඩසටහන සඳහා සමස්ථ කාර්ය මණ්ඩලය සහභාගී වී ඇත.



- කොමිසමේ එක් නිලධාරියෙක් ව්‍යාපාර අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලාව (Master of Business Studies (MBS) - 2020 (අවුරුදු 01) සඳහා ද, තවත් නිලධාරියෙක් Higher National Diploma in Public Procurement and Contract Administration (HN) DIPPCA) - 2020/2021 (අවුරුදු 01) සඳහා ද යොමු කර ඇත.

- සේවක අභිප්‍රේරණය සහ සහයෝගීතාවය වර්ධනය කර ගැනීමේ අරමුණින් සංවිධානය කරන ලද Out Bound Training වැඩසටහන කොමිසමේ සියළු කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් සිංහරාජ වැසි වනාන්තරය ආශ්‍රිතව පැවැත්වීමට කටයුතු කරන ලදී.



3. මූල්‍ය ප්‍රකාශනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
මූල්‍ය තත්ත්ව විස්තරය

දෙසැම්බර් 31 න් අවසන් දිනට	සටහන්	2020 රු.	2019 නැවත සකස් කල රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	**66,587,892**	101,732,442
උත්සව අත්තිකාරම්		**-**	3,300
ණයගැතියෝ		**10,491,776**	1,010
වෙනත් ලැබීම්		**10,000**	56,401
නැවත ලැබිය යුතු තැන්පතුව	2	**2,407,000**	2,405,000
දිගුකාලීන අපදා ණය		**756,212**	676,723
COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය		**994,714**	-
ජාතික ආධුනිකත්ව සහ පුහුණු අධිකාරිය වෙතින් ලැබීම්		**7,560**	7,560
වෙනත් අත්තිකාරම්		**136,633**	136,633
ඉදිරියට කල ගෙවීම්	3	**592,860**	2,270,558
නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		**1,050,885**	10,289,283
(අඩු කළා) අඩමාන ණයකරුවන් සඳහා වෙන්කිරීම (100%)	4	**(9,802,964)**	(9,802,964)
ඉන්ධන තැන්පතු		**100,000**	100,000
ටී ෂර්ට් තොග	5	**414,480**	415,265
ලිපි ද්‍රව්‍ය තොග	5	**445,954**	485,246
		74,193,002	**108,776,457**
ජංගම නොවන වත්කම්			
නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		**2,198,830**	236,600
COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය		**994,376**	
ආපදා ණය		**2,672,247**	2,493,253
දේපළ, පිරියත හා උපකරණ	6	**35,478,691**	9,953,626
		41,344,145	**12,683,479**
මුළු වත්කම්		**115,537,147**	**121,459,935**
අරමුදල් සහ බැරකම්			
ජංගම බැරකම්			
ණයහිමි	7	**167,330**	3,862,139
උපචිත වියදම්	8	**2,365,509**	12,185,469
		2,532,840	16,047,609
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික වෙන්කිරීම්	9	**3,682,614**	2,820,257
IAFM-SL ව්‍යාපෘතිය	10	**36,472,155**	46,472,155
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	11	**45,417,472**	51,202,448
ප්‍රාග්ධන දායක අරමුදල	12	**14,334,314**	(3,842,091)
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල	13	**13,240,886**	8,998,495
මුළු බැරකම්		**115,680,281**	**121,698,872**
ශුද්ධ වත්කම්		**(143,134)**	**(238,937)**
ශුද්ධ වත්කම්/ හිමිකම්			
සම්මුවිචිත අරමුදල		**(143,134)**	(238,936)
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		**(143,134)**	**(238,936)**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 47 සිට 55 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ඩී. ඒ. සරත්චන්ද්‍ර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ/ප්‍ර.විධායි.

මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

මහාචාර්ය ආර්. යූ. හල්වතුර
කොමසාරිස්

මහාචාර්ය. නිලිකා මලවිගේ
සහකාර කොමසාරිස්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2020 රු.	2019 නැවත සකස් කල රු.
ආදායම්			
රජයේ දායකත්වය			
රජයේ දායකත්වය - පුනරාවර්තන	14	40,600,000	42,699,775
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ව්‍යාපෘති වියදම්	18	4,355,907	69,430,417
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		270,000	352,315
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය වීම් / ජංගම නොවන වත්කම්	6	1,735,688	1,815,558
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම ක්‍රමක්ෂය -යන්ත්‍ර හා උපකරණ		5,784,976	37,639
වෙනත් ආදායම්	15	1,559,070	359,143
මුළු ආදායම		**54,305,639**	**114,694,846**
වියදම්			
පුද්ගලික වේතන	16	17,430,480	17,557,905
පරිපාලන සහ ආයතනික වියදම්	17	25,154,266	29,719,337
ක්ෂය - ස්ථාවර වත්කම්	6	7,520,664	1,853,197
පාරිතෝෂික	9	862,357	708,053
නව නිපැයුම්කරුවන්ගේ දිරි දීමනා වියදම්	18	4,355,907	69,430,417
වෙනත් වියදම්	19	7,863	15,604
මුළු වියදම්		**55,331,537**	**119,284,512**
වසර සඳහා අතිරික්තය / (හිඟය)		**(1,025,898)**	**(4,589,666)**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 47 සිට 55 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	සටහන්	සම්මුවිචිත අරමුදල	මුළු ස්කන්ධය
		රු.	රු.
2019 ජනවාරි 01 දිනට ශේෂය		4,302,294	4,302,294
2019 වර්ෂය සඳහා අතිරික්තය / (හිහය)		(4,589,666)	(4,589,666)
පෙර වර්ෂය සඳහා අවලංගු කරන ලද වියදම්		28,800	28,800
NERD ආයතනයෙන් ආපසු ලද පෙර වර්ෂයේ වියදම්		182,181	182,181
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය		(76,391)	(76,391)
2019 වර්ෂය සඳහා වන ගැලපීම්			
ක්ෂය අධිවෙන් කිරීම		11,352	11,352
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීමේ අරමුදලට අදාලව සිදුකරන ලද යන්ත්‍රෝපකරණ සහ උපකරණ ක්ෂය අධි වෙන්කිරීම		(11,352)	(11,352)
ඉදිරියට කරන ලද කොන්ත්‍රාත් සේවා පෙර ගෙවීම් නිවැරදි කිරීම		(166,833)	(166,833)
ඉදිරියට කරන ලද ප්‍රාග්ධන වියදම් වාර්තා කිරීම		118,828	118,828
2019 වර්ෂය වෙනුවෙන් හඳුනා ගත් ගෙවිය යුතු වියදම් වාර්තා කිරීම		(114,541)	(114,541)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කිරීම්)		**(238,936)**	**(238,936)**
2020 ජනවාරි 01 දිනට ශේෂය		(238,936)	(238,936)
2020 වර්ෂය සඳහා අතිරික්තය / (හිහය)		(1,025,898)	(1,025,898)
2018 වර්ෂයේ දී W.M ජයවර්ධන මහතා විසින් ලබා ගත් අරමුදල් පියවීම		603,810	603,810
පෙර වර්ෂය සඳහා අවලංගු කරන ලද ඉදිරියට කරන ලද වියදම්		6,000	6,000
වැඩිපුර ගෙවන ලද විනිශ්චය ගාස්තු		1,260	1,260
NERD ආයතනයෙන් ආපසු ගෙවන ලද වියදම්		521,531	521,531
නිවැරදි කරන ලද ආපදා ණය ලේඛණයේ ඉතිරිය		(10,902)	(10,902)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		**(143,134)**	**(143,134)**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 47 සිට 55 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්			
අතිරික්තය/හිඟය		(1,025,898)	(4,589,666)
මුදල් නොවන සංචලන			
ක්ෂයවීම්	6	7,520,664	1,864,549
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ව්‍යාපෘති වියදම්	18	(4,355,907)	(69,430,417)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම සම්බන්ධ වෙනස්වීම		(270,000)	(352,315)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය වීම් / ජංගම නොවන වත්කම්		(7,520,664)	(1,864,549)
NIPO ආයතනයෙන් ආධාර වශයෙන් ලද පරිගණකය		(70,000)	-
අවලංගු කරන ලද වියදම්		-	28,800
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම්	9	862,357	708,053
අපහරණයෙන් ලද ලාභය		-	(300)
නිවැරදි කරන ලද ආපදා ණය ලේඛණයේ ඉතිරිය		(10,902)	-
ඉවත් කිරීමේ අලාභ		2,732	15,360
ගැලපීම් :			
ණයගැතියන් වෙනස්වීම්		1,010	240
ලිපි ද්‍රව්‍ය තොග වෙනස්වීම්		39,292	(53,800)
වී ෂර්ට් තොග වෙනස්වීම්		785	260,620
ඉදිරියට කල වියදම් හි වෙනස්වීම්	3	1,677,698	1,962,846
උත්සව අත්තිකාරම් හි වෙනස්වීම්		3,300	-
ගෙවිය යුතු වියදම් හි වෙනස්වීම්		(9,819,960)	10,325,412
ලැබිය යුතු දැ හි වෙනස්වීම්		46,401	(56,401)
නැවත ගෙවිය යුතු තැන්පතුහි වෙනස්වීම්		(2,000)	5,000
ණයහිමියන්ගේ වෙනස්වීම්		(3,694,809)	3,857,339
පෙර වර්ෂය සඳහා මුදල්මය ලැබීම්		1,132,601	182,181
		(15,483,301)	(57,137,047)
පරිතෝෂික ගෙවීම්		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(15,483,301)**	(57,137,047)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම්	6	(32,978,461)	(5,427,862)
විකුණුම් මිල		-	1,010
ණය-නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් නැවත ගෙවීම්		469,552	490,340
ණය-නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් සඳහා වියදම්		(935,566)	-
ආපදා ණය ප්‍රදාන		(981,649)	(1,697,626)
ආපදා ණය නැවත ගෙවීම්		709,169	562,933
"COVID 19 වැඩසටහන" යටතේ ලබා දුන් ප්‍රදාන		(4,808,043)	-
"COVID 19 වැඩසටහන" යටතේ ලබා දුන් ණය		(2,350,000)	-
"නව නිපැයුම් දිරිය වැඩසටහන" යටතේ ලබා දුන් ණය		(3,324,250)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(44,199,248)**	(6,071,205)
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
ලැබූ ප්‍රාග්ධන ප්‍රවාහ		24,538,000	58,000,000
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	11	-	5,000,000
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය		**24,538,000**	63,000,000
වසර තුළදී ශුද්ධ මුදල් හා මුදල් සමාන දේ (වැඩි වීම/ අඩු වීම)		(35,144,550)	(208,250)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ		101,732,442	101,940,693
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ		**66,587,892**	**101,732,442**
මුදල් හා මුදල් සමාන දේ විශ්ලේෂණය			
A/C No.033-1-001-0-1791066		10,965,343	905,441
A/C No.033-1-001-2-1791065		54,567,720	100,664,518
A/C No.204402131791066		1,054,829	162,483
		66,587,892	101,732,442

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 47 සිට 55 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
අයවැය හා සංචිතයන් සංසන්දනය කිරීම

LKR

	අනුමත අයවැය		මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද සංචිත	
	2020	**2019**	**2020**	**2019**
පුනරාවර්තනය	**40,600,000.00**	50,000,000.00	**40,600,000.00**	42,699,775.00
ප්‍රාග්ධනය	**43,300,000.00**	90,000,000.00	**24,538,000.00**	58,000,000.00
එකතුව	**83,900,000.00**	**140,000,000.00**	**65,138,000.00**	**100,699,775.00**

වර්ෂය	රජයේ දායකත්වය ප්‍රාග්ධන (ශ්‍රී. ලං. රු)
1991	163,050.00
1992	1,700,000.00
1993	-
1994	250,000.00
1995	196,000.00
1996	113,500.00
1997	757,000.00
1998	1,700,000.00
1999	290,000.00
2000	4,500,000.00
2001	2,870,000.00
2002	700,000.00
2003	2,500,000.00
2004	621,000.00
2005	5,997,000.00
2006	33,991,000.00
2007	37,100,000.00
2008	24,106,000.00
2009	15,765,000.00
2010	4,500,000.00
2011	6,151,010.00
2012	21,562,000.00
2013	17,061,000.00
2014	40,000,000.00
2015	30,269,992.00
2016	57,248,655.00
2017	73,133,822.00
2018	85,750,000.00
2019	58,000,000.00
2020	24,538,000.00

විශේෂිත ව්‍යාපෘති (අයවැය යෝජනාවන් - 2017)

ව්‍යාපෘතියේ නම	රාජ්‍ය ප්‍රාග්ධනයන්	
	2020	**2019**
IAFM-SL ව්‍යාපෘතිය	-	-
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	-	5,000,000.00

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පරිපාටීන්

1. කොමිසමේ තොරතුරු

1.1 ආයතනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම් දිරිගැන්වීමේ පනත යටතේ නව නිපැයුම් දිරිගැන්වීම , ප්‍රවර්ධනය හා නිෂ්පාදන සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.
කොමිසම ක්‍රියාත්මක වන්නේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේය.
2020 වර්ෂයේ කොමිසමේ කාර්යාලය, අංක 46 සහ 48, කොටා පාර, කොළඹ 08 හි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අදාලව ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා වේ.

2.1 අනුකූලතා ප්‍රකාශනය

විගණකාධිපති සහ මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ කමිටුව විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදි.

මෙම මූල්‍ය ප්‍රකාශන වල පහත සඳහන් අංශ ඇතුලත් වේ.

- මූල්‍ය ත්ත්ත්ව ප්‍රකාශනය
- මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි.

2.3 ඇගයීම් කිරීමේ පදනම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇති අතර උද්ධමන සාධක සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු කර නොමැත.

2.4 ව්‍යවහාර මුදල් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරිත්වය

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනයේ ක්‍රියාකාරී මුදල් වේ. මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

2.5 ප්‍රමාණාත්මක බව, හිලව් කිරීම, වැටයිම් කිරීම

ප්‍රමාණාත්මක බව

සමාන අයිතමයන්හි ප්‍රමාණාත්මක අගයන් මූල්‍ය ප්‍රකාශයන්හි වෙන් වෙන්ව දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 1 මගින් අවසර ලබා දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවන අයිතමයන් ඒවායේ ස්වරූපය හා ක්‍රියාකාරීත්වයේ අසමානතාවය පදනම් කරගනිමින් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශ දක්වා ඇත.

හිලව් කිරීම

රාජ්‍ය අංශයට ගිණුම්කරණ ප්‍රමිති වලට අවශ්‍ය පරිදි අවසර දී ඇත්නම් මූල්‍ය ප්‍රකාශන වලින් වත්කම් වගකීම් ආදායම් වියදම් හිලව් කිරීම නොකරයි.

වැටයිම් කිරීම

මූල්‍ය ප්‍රකාශන වල ඇති මුදල ආසන්නතම රුපියල් වලට එකතු කර ඇත.

2.6 අඛණ්ඩ පැවැත්ම

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන වේ.

2.7 වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම්

වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම් යනු වාසිදායක හා අහිතකර සිදුවීම් වන අතර ඒවා වාර්තා කිරීමේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරණ ලද දිනය අතර වේ.

මේ සම්බන්ධයෙන් මෙම වර්ෂය සඳහා වාර්තා කිරීමේ කාලයෙන් පසුව කිසිදු සිදුවීමක් නොමැත.

3. විදේශ මුදල් ගණුදෙනු

ගනුදෙනු සිදුකරන අවස්ථාවේ පවත්නා විනිමය අනුපාතය අනුව සියළුම විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වේ.

ශ්‍රී. ල. ගි. ප්‍ර. 21 අනුව ආයතනය විසින් විදේශ මුදල් අයිතම එහි ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරන අතර ඒ අනුව එම පරිවර්තනය වාර්තා කරනු ලැබේ.

4. දේපල හා උපකරණ

4.1 හඳුනා ගැනීමේ පදනම

දේපල හා උපකරණ යනු සේවා සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති ස්පර්ශ අයිතම වන අතර ඒවා වසරකට වැඩි කාලයක් තුල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

4.2 ඇගයීමේ පදනම

වත්කමක් ලෙස පිලිගැනීමට සුදුසුකම් ලබන දේපල හා උපකරණ අයිතමයක් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයෙනි. පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපනය වන වියදම් සහ එහි කොටසක් එකතු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත් වේ.

මිලදී ගන්නා ලද අදාල උපකරණ වල ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වන පරිගණක මෘදුකාංග වැනි දෑ එම උපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපල හා උපකරණ වල කොටස් වලට විවිධ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇති විට, ඒවා දේපල හා උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන කොටස්) ලෙස ගණන් ගැනේ.

අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා විවිධ මූල්‍ය කාලසීමාව තුළ ලාභය හෝ අලාභය ප්‍රකාශනයට ගලපනු ලැබේ.

පවත්නා වත්කම් වල මෑතකදී තක්සේරු කරන ලද කාර්යසාධනයේ ප්‍රමිතියට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි නම් ප්‍රතිසංස්කරණය මඟින් හඳුනා ගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරයි.

අදාල වත්කම් වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් කාලය තුල ප්‍රධාන අලුත්වැඩියාවන් ක්ෂය කරනු ලැබේ.

4.3 ක්ෂය

දේපල උපකරණ අයිතම වල එක් එක් කොටස් හි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර ලාභ අලාභ ප්‍රකාශනයේ ක්ෂය වීම් ලෙස දක්වා ඇත.

වත්මන් හා සන්සන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ.

වත්කම් පන්තිය	වාර්ෂික අනුපාතය	කාලය
ගෘහ භාණ්ඩ උපකරණ	15%	6 2/3
කාර්යාලයීය උපකරණ	20%	05
මුලාකෘති සැලසුම් සහ නාම පුවරු	10%	10
මෝටර රථ හා වාහන	20%	05
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	20%	05
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	20%	05
කාර්යාලයීය සවිකුරු	15%	6 2/3
තාක්ෂණ බීජෞෂණාගාර යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	20%	05

2014 ජනවාරි 01 වන දින සිට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 භාවිතා කෙරේ.

4.4 සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල හා උපකරණ

මූල්‍ය තත්වයේ දිනය වන විටත් භාවිතයේ පවතින කොමිසම සතු සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල හා උපකරණ වල පිරිවැය පහත පරිදි වේ.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2020 (රු.)	2019 (රු.)
ගෘහ භාණ්ඩ උපකරණ	708,582	708,582
කාර්යාලයීය උපකරණ	5,487,982	6,214,432
මෝටර රථ හා වාහන	16,470,191	16,470,191
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	1,354,940	1,266,440
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	111,750	111,750
එකතුව	**24,133,445**	**24,771,395**

4.5 සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලද දේපල හා උපකරණ

කොමිසමේ පහත සඳහන් දේපල හා උපකරණ වාර්තා කරන දිනට සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලදී.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2020 (රු.)	2019 (රු.)
කාර්යාලයීය උපකරණ	98,887	98,887
මූලාකෘති සැලසුම් සහ නාම පුවරු	110,805	110,805
ප්‍රදර්ශන ශාලා	37,690	37,690
කාර්යාලයීය සවිකුරු	1,065,682	1,085,682
එකතුව	**1,313,064**	**1,333,064**

5. විස්තර කරන ලද දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාල ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසකම් ලබයි.

සේවක අර්ථසාධක අරමුදල කොමිසමෙන් 15% ක් සහ සේවකයන්ගෙන් 10% ක් සේවකයන්ගේ දළ වැටුපෙන් දායක වේ.

සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් කොමිසම සේවක භාර අරමුදලට දායක වේ.

6. අරමුදල්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට රජයේ දායකත්වය, රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අයිතම 02 ක් යටතේ සපයනු ලැබේ.

1. පුනරාවර්තන වියදම් සඳහා අරමුදල්

2. ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල්

ශ්‍රී. ල. ගි. ප්‍ර. 20 අනුව පුනරාවර්තන ප්‍රදාන ආදායම් හා වියදම් ගිණුමට ගෙන යන අතර ප්‍රාග්ධන ප්‍රදානය ඒ අනුව ගණනය කෙරේ.

කොමිසමේ පුනරාවර්තන වියදම් පහත සඳහන් පරිදි ආදායම් හා වියදම් ගිණුමේ දක්වා ඇත.

1. ආයතන හා පරිපාලන වියදම්

2. පෞද්ගලික වේතන

ප්‍රාග්ධන වියදම් නියෝජනය කරනු ලබන්නේ 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ අරමුණු සපුරාලීම සඳහා කොමිසම විසින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වන වියදමයි.

7. මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව වක්‍ර ක්‍රමයට සකස් කර ඇත.

8. අරමුදල් එකතු කිරීම/ අනුග්‍රාහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයකින් ලැබෙන පරිත්‍යාග

කොමිසමේ ප්‍රතිපාදන ගිණුම මඟින් පෙන්නුම් කරනුයේ අනුග්‍රාහකයින්ගේ සහ තෙවන පාර්ශවයන්ගෙන් රැස් කරන ලද අරමුදල් වේ.

ප්‍රකාශනය සඳහා සටහන්

		2020	2019 Restated
		LKR	LKR
1	මුදල් හා මුදල් සමාන දෑ		
	# මුදල් පොත - 033100101791066	10,965,343	905,441
	# මුදල් පොත - 033100121791065	54,567,720	100,664,518
	# මුදල් පොත - 204402131791066 (විදේශ මුදල්)	1,054,829	162,483
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**66,587,892**	101,732,442
2	නැවත ලැබිය යුතු කැන්පතු		
	Gavinro Property Developers	2,400,000	2,400,000
	Mobitel (Pvt)Ltd	2,000	-
	Express Water System (Pvt) Ltd	5,000	5,000
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**2,407,000**	2,405,000
3	**Pre Payments**		
	Prepayment Contractual service	516,860	534,542
	Prepayment of rent	-	1,617,188
	Prepayment for Provincial	-	49,508
	Prepayment Sahasak Nimeum	76,000	69,320
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**592,860**	2,270,558
4	අඩමාණ ණයකරුවන් සඳහා **100%** වෙන් කිරීම		
	ජනවාරි 01 දිනට ශේෂය	9,802,964	9,802,964
	වර්ෂය සඳහා වෙන් කිරීම්	-	-
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**9,802,964**	**9,802,964**
5	තොග ඇගයීම **(SLPSAS 9)**		
	වර්ෂය අවසානයේ ඇති ලිපි තොග (FIFO) ක්‍රමය පදනම් කරගනිමින් ශ්‍රී. ල. රා. ගි. ප්‍ර. අංක		
	ලිපි ද්‍රව්‍ය		
	ජනවාරි 01 දිනට ශේෂය	485,246	431,446
	වර්ෂය තුළ මිලදී ගැනීම්	490,524	961,655
	වර්ෂය තුළ වියදම්	(529,816)	(907,855)
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**445,954**	485,246
	ටී - ෂර්ට		
	ජනවාරි 01 දිනට ශේෂය	415,265	675,885
	වර්ෂය තුළ මිලදී ගැනීම්	-	-
	වර්ෂය තුළ වියදම්	785	260,620
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**414,480**	415,265

6 ක්ෂය - ස්ථාවර වත්කම්

	කාර්යාලයීය උපකරණ	ගෘහ භාණ්ඩ උපකරණ	මූලාකෘති සැලසුම් සහ නාම පුවරු	වාහන	ප්‍රදර්ශන කුටි	ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	කාර්යාලයීය සවිකුරු	යන්ත්‍ර සූත්‍ර හා සවිකුරු (තාක්ෂණ බීජෞෂණාගාර)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය										-
2019 ජනවාරි 01 දිනට ශේෂය	11,746,927	2,426,391	211,305	16,470,191	37,690	1,367,990	950,300	1,159,502	-	**34,370,296**
වර්ෂය තුළදී එකතුවීම්	-	-	-	-	-	910,060	-	-	4,517,802	**5,427,862**
වර්ෂය තුළදී අපහරණයන්	(4,470)	(14,166)	-	-	-	(13,050)	-	(20,000)	-	**(51,686)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන	**11,742,457**	**2,412,224**	**211,305**	**16,470,191**	**37,690**	**2,264,999**	**950,300**	**1,139,502**	**4,517,802**	**39,746,471**
වර්ෂික ක්ෂයවීම්	88,315	-	-	-	-	-	-	-	32,960,146	**33,048,461**
වර්ෂය තුල වූ අපහරණයන්	(773,390)	-	-	-	-	-	-	-	-	**(773,390)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,057,382**	**2,412,224**	**211,305**	**16,470,191**	**37,690**	**2,264,999**	**950,300**	**1,139,502**	**37,477,948**	**72,021,542**
						-			-	
සමුච්චිත ක්ෂය වීම්									-	
2019 ජනවාරි 01 දිනට ශේෂය	7,745,356	1,232,941	151,113	16,458,958	37,690	1,338,312	470,478	540,420	-	**27,975,265**
වර්ෂය තුළ ගෙවීම්	1,301,200	255,547	10,050	11,233	-	58,713	167,742	11,073	37,639	**1,853,197**
අපහරණයන්	(2,868)	(14,166)	-	-	-	(13,050)	-	(5,532)	-	**(35,616)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන	**9,043,688**	**1,474,321**	**161,163**	**16,470,191**	**37,690**	**1,383,975**	**638,220**	**545,961**	**37,639**	**29,792,845**
වර්ෂික ක්ෂයවීම්	1,097,319	255,547	10,050	-	-	193,990	167,710	11,073	5,784,976	**7,520,664**
අපහරණයන්	(770,658)	-	-	-	-	-	-	-	-	**(770,658)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**9,370,349**	**1,729,868**	**171,213**	**16,470,191**	**37,690**	**1,577,965**	**805,930**	**557,034**	**5,822,614**	**36,542,851**
ශුද්ධ පොත් අගය									-	
2019 දෙසැම්බර් 31 දිනට	2,698,769	937,902	50,143	-	-	881,024	312,080	593,540	4,480,163	**9,953,626**
2020 දෙසැම්බර් 31 දිනට	**1,687,033**	**682,356**	**40,093**	**-**	**-**	**687,034**	**144,370**	**582,467**	**31,655,334**	**35,478,691**

ප්‍රකාශනය සඳහා සටහන්

		2020	2019 Restated
		LKR	LKR
7 ගෙවිය යුතු වියදම්			
# ණයහිමියෝ		167,330	3,862,139
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**167,330**	3,862,139
8 උපචිත වියදම්			
ගෙවිය යුතු පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක වියදම්		56,235	59,411
ගෙවිය යුතු ජල ගාස්තු		13,080	7,837
ගෙවිය යුතු විදුලිය ගාස්තු		105,863	122,568
ගෙවිය යුතු දුරකථන ගාස්තු		58,277	39,782
ගෙවිය යුතු ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		59,165	21,997
ගෙවිය යුතු විගණන ගාස්තු		874,700	1,724,300
ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු වියදම්		-	1,398
ගෙවිය යුතු අතිකාල දීමනා		189,858	122,113
ගෙවිය යුතු කොන්ත්‍රාත්තුමය සේවා සඳහා ගෙවීම්		89,050	141,980
සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ගෙවිය යුතු		826,784	6,334,534
ගෙවිය යුතු වෙනත් දීමනා		2,000	96,500
ගෙවිය යුතු ගමන් ගාස්තු		25,987	4,070
ගෙවිය යුතු වාහන නඩත්තු හා සැකසීමේ වියදම්		-	25,982
ගෙවිය යුතු නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම් ප්‍රවර්ධනය		46,500	2,326,054
ගෙවිය යුතු ජාත්‍යන්තර ප්‍රදර්ශන වියදම්		-	111,003
පලාත් නව නිපැයුම් කරහ හා ප්‍රදර්ශන සඳහා ගෙවිය යුතු වියදම්		-	177,000
ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම්		-	6,000
ගෙවිය යුතු වැඩ බැලීමේ දීමනාව		-	111,686
ගෙවිය යුතු මුද්දර ගාස්තු වියදම්		3,750	1,950
ගෙවිය යුතු නව නිපැයුම් සමාජ පිහිටුවීමේ වියදම්		-	715,000
ගෙවිය යුතු පරිපාලන වියදම්		14,260	21,080
ගෙවිය යුතු ප්ටන්ට් බලපත්‍ර සඳහා ගෙවීම්		-	13,225
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**2,365,509**	12,185,469
9 පාරිතෝෂික			
1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ පාරිතෝෂික ගණනය කිරීම් සිදු කර ඇත.			
ජනවාරි 01 දිනට ශේෂය		2,820,257	2,112,204
වර්ෂය සඳහා වෙන් කිරීම්		862,357	708,053
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම්		-	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**3,682,614**	**2,820,257**
10 IAFM-SL ව්‍යාපෘතිය			
ජනවාරි 01 දිනට ශේෂය		46,472,155	5,000,000
වර්ෂය තුල ප්‍රදාන ලැබීම්		-	50,599,755
වර්ෂය තුල සිදුකරන ලද වියදම්		-	(9,127,600)
නව නිපැයුම් අරමුදල මහින් මාරු කිරීම		(10,000,000)	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**36,472,155**	46,472,155
11 තාක්ෂණ බීජෝෂණාගාර ස්ථාපිත කිරීම			
ජනවාරි 01 දිනට ශේෂය		51,202,448	46,240,087
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්			5,000,000
තාක්ෂණ බීජෝෂණාගාර ස්ථාපිත කිරීම සඳහා වියදම්			
ක්‍රමක් ක්ෂය කිරීම් - රජරට විශ්ව විද්‍යාලය	5	(2,716,097)	(28,039)
ක්‍රමක් ක්ෂය කිරීම් - රුහුණු විශ්ව විද්‍යාලය	5	(3,068,879)	(9,599)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**45,417,472**	51,202,448
12 ප්‍රාග්ධන ප්‍රදානයන්			
ජනවාරි 01 දිනට ශේෂය		(3,842,092)	9,756,200
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		24,538,000	58,000,000
ව්‍යාපෘති සඳහා සිදුකරන ලද වියදම්	17	(4,355,907)	(69,430,417)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම්		(270,000)	(352,315)
ස්ථාවර වත්කම් සඳහා වර්ෂික ක්ෂයවීම්	5	(1,735,688)	(1,815,558)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**14,334,314**	(3,842,092)

ප්‍රකාශනය සඳහා සටහන්

	2020	2019 Restated
	LKR	LKR
13 නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		
ජනවාරි 01 දිනට ශේෂය	8,998,495	8,998,495
IFMSL - ව්‍යාපෘතිය මඟින් ලද ප්‍රදානයන්	10,000,000	-
"COVID 19 වැඩසටහන" යටතේ බෙදාහරින ලද ප්‍රදානයන්	(4,822,043)	-
නව නිපැයුම් ආකෘතින් සැකසීම වෙනුවෙන් NERD ආයතනය කරන ලද වියදම්	(630,000)	-
කොවිඩ් නව නිපැයුම් ඇගයීම වෙනුවෙන් කරන ලද ගෙවීම	(125,000)	-
නව නිපැයුම් වල තක්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් ITI - ආයතනයට ගෙවන ලද වියදම්	(176,040)	-
නව නිපැයුම් වල තක්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් Nano Technology (Pvt) Ltd ආයතනයට ගෙවන ලද වියදම්	(4,526)	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**13,240,886**	8,998,495
14 රාජ්‍ය දායකත්වය		
රජයේ දායකත්වය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.		
ශ්‍රී. ලං. ගි. පු. 24ට අනුව		
පුනරාවර්තන ප්‍රදාන	40,600,000	42,699,775
ප්‍රාග්ධන ප්‍රදාන	24,538,000	58,000,000
වර්ෂය සඳහා	**65,138,000**	100,699,775
15 වෙනත් ආදායම්		
ආපදා ණය - පොළිය	112,336	117,617
විදේශ මුදල් - පොළිය	10,601	825
සුළු ආදායම්	70,694	78,500
අපහරණ ලාභ	-	300
සහසක් නිමැවුම් -විදේශ නව නිපැයුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ කුටි ගාස්තු	1,322,051	161,901
නිෂ්පාදන භාග ලැබීම්	43,387	-
	1,559,070	**359,143**
16 පුද්ගලික වේතන		
වැටුප් සහ වේතන	10,881,623	9,729,078
ජීවන වියදම් දීමනාව	2,169,028	2,209,035
වෘත්තිය දීමනා	131,768	143,806
වෙනත් දීමනා	565,500	583,500
වැටුප් රහිත නිවාඩු ගාස්තු	(2,511)	(14,895)
වැඩ බැලීමේ දීමනාව	-	115,438
ගැලපුම් දීමනාව	-	145,631
සේවා නියුක්තිකයන්ගේ අර්ථ සාධක අරමුදල	1,957,221	1,788,483
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	391,444	357,697
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	406,108	872,738
කොමිසමේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමිකය ගෙවීම්	660,299	1,275,080
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම	270,000	352,315
	17,430,480	**17,557,905**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2020 LKR	2019 Restated LKR
17	**ආයතන හා පරිපාලන වියදම්**		
	දේශීය ගමන් වියදම්	149,471	508,121
	විදේශීය ගමන් වියදම්	-	32,550
	ලිපි ද්‍රව්‍ය	539,709	1,054,432
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	582,417	658,844
	කාර්යාලීය උපකරණ - අලුත්වැඩියාව සහ නඩත්තුව	24,820	161,672
	වාහන - අලුත් වැඩියාව සහ නඩත්තුව	923,526	1,243,257
	තැපැල් ගාස්තු	43,035	102,851
	සන්නිවේදන ගාස්තු	697,679	639,103
	උපයෝගී වියදම්	39,853	42,645
	කොන්ත්‍රාත්තුමය වියදම්	1,694,084	1,921,055
	විදුලි ගාස්තු	1,290,361	1,784,374
	පිරිසිදු කිරීමේ වියදම්	499,913	700,244
18	**නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්**		
	මූලික මට්ටමේ පසුවන නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම්කරණය දිරිගැන්වීම	61,180	417,440
	පළාත් නව නිපැයුම් ප්‍රදර්ශන හා තරඟය	922,971	3,865,778
	නව නිපැයුම්කරුවන්ගේ දිනය වැඩසටහන	-	-
	"Innova Minds" වැඩසටහන	-	365,730
	නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන	904,194	6,935,565
	ජනාධිපති සම්මාන ප්‍රධාන උළෙල	-	18,000
	විනිශ්ච මණ්ඩලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	-	-
	සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය	1,017,820	22,098,263
	ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය	-	20,121,250
	යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	-	3,803
	පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා මූල්‍ය දායකත්වය	-	172,504
	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	557,812	1,198,444
	වැඩමුළු / සම්මන්ත්‍රණ පැවැත්වීම	-	159,553
	පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට නව නිපැයුම්කරුවන්ට සහයවීම	37,210	475,438
	SLAAS - FITI - 2020 වැඩසටහන	509,750	-
	Wild Life වැඩසටහන	344,971	-
	නව නිපැයුම් සමාජය පිහිටුවීම	-	1,910,377
	නව නිපැයුම්කරුවන් සමඟ කාර්තුමය වශයෙන් හමුවීම් සංවිධානය	-	369,890
	ශිල්පශේනා	-	11,318,383
		4,355,907	**69,430,417**
19	**වෙනත් වියදම්**		
	අපහරණ ලාභ (අනෙකුත් උපකරණ)	2,732	15,360
	විදේශ මුදල් පුරෝකථන මුදල් ගනුදෙනුවේ පාඩුව	5,131	206
	WHT - විදේශ මුදල් ගිණුම	-	38
		7,863	**15,604**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TEC/B/SLIC/1/20/12 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 මැයි 31 දින

කොමසාරිස්,
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිසමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිසමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිසමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිසම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිසම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිසමේ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ට ඔවුන්ගේ නිපැයුම් වෙළඳපොලට රැගෙන ඒමටත්, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහාත් යාන්ත්‍රනයක් ඇති කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.මිලියන 5 ක ප්‍රතිපාදනයක් සහිතව ආරම්භ කර තිබූ නවෝත්පාදන කඩිනම් කරවීමේ යාන්ත්‍රන අරමුදලේ සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබුණු රු.46,472,155 ක ශේෂයෙන් රු. මිලියන 10 ක් නිපැයුම්කරුවන්ගේ අරමුදලට මාරුකිරීම හැර වෙනත් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

(ආ) නව නිපැයුම්කරුවන්ට ලබා දී තිබුණු රු.9,802,964 ක ණය මුදල් නැවත අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගෙන එම ණය ශේෂය සඳහා සියයට සියයක අඩමාණ ණය වෙන්කිරීමක් කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති



ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

අංක : 46 සහ 48, කොටා පාර, කොළඹ 08.

දුරකථන : 011-2676650 ෆැක්ස් : 011-2676646

ඊ මේල් : info@slic.gov.lk වෙබ් අඩවිය : www.slic.gov.lk

இலங்கை புத்தாக்குனர் ஆணைக்குழு

46 & 48, கொட்டா வீதி, கொழும்பு 08.

தொலைபேசி : 011-2676650 தொலைநகல் : 011-2676646

மின்னஞ்சல் : info@slic.gov.lk இணையத்தளம் : www.slic.gov.lk

SRI LANKA INVENTORS COMMISSION

No : 46 & 48, Cotta Road, Colombo 08.

Tel : 011-2676650 Fax : 011-2676646

Email : info@slic.gov.lk Web : www.slic.gov.lk